සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 13, Second Term Test, March 2020**

ආර්ථික විද්‍යාව - I

**Economics - I**

21 S I

පැය 02 යි

**Time: 02 hour**

විභාග අංකය : ....................................................................

**උපදෙස් :**

- **අංක 01 සිට 50 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එම අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉරි මත ලියන්න.**

01. නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව පවතින ආර්ථිකයක,

    1. ජනතාවගේ වුවමනා ඉටුකරලීමට සම්පත් උපයෝජනය වෙයි.
    2. සම්පත් පූර්ණ හා උපරිම කාර්යක්ෂමතාවයෙන් නිෂ්පාදනයට යොදා ගැනෙයි.
    3. ජනතාව විභව නිමැවුම ඉක්ම වූ පරිභෝජන මට්ටමක් පවත්වා ගෙන යයි.
    4. ආර්ථික සාධාරණත්වය තහවුරු වෙයි.
    5. පරිභෝජන භාණ්ඩවලට වඩා ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනය වෙයි.

(.............)

02. පහත දැක්වෙන දෑ අතරින් සංසරණ ප්‍රාග්ධනයට අයත් වන්නේ මොනවා ද?

    1. ගොඩනැගිලි හා යන්ත්‍රෝපකරණ
    2. ක්‍රීඩා සමාජ හා මරණාධාර සමිති
    3. ආරෝග්‍යශාලා සහ පාසල්
    4. අර්ධ නිමි ද්‍රව්‍ය හා අමු ද්‍රව්‍ය
    5. භාණ්ඩාගාර බිල්පත් සහ ව්‍යාපාර කොටස්


(.............)

03. සමාජ සුභසාධනය සඳහා වඩා ක්‍රියාකාරී ලෙස රජය මැදිහත්වන ආර්ථික පද්ධතිය වන්නේ,

    1. මිශ්‍ර ආර්ථික පද්ධතියයි
    2. සැලසුම් ආර්ථික පද්ධතියයි
    3. වෙළෙඳපොළ ආර්ථික පද්ධතියයි
    4. සමාජ වෙළෙඳපොළ ආර්ථික පද්ධතියයි
    5. සමාජවාදී වෙළෙඳපොළ ආර්ථික පද්ධතියයි

(.............)

04.




ප්‍රස්තාර සටහනට අනුව ආර්ථිකය X සංයෝගයෙන් Z සංයෝගයට මාරු වූයේ නම්,

1. සම්පත් ඌන උපයෝජනය වී අකාර්යක්ෂම නිමැවුමක් බිහි වේ.
2. සම්පත් අධි උපයෝජනය වී කාර්යක්ෂම නිමැවුමක් බිහි වේ.
3. සම්පත් කාර්යක්ෂමව උපයෝජනය වී මිනිස් වුවමනා ඉටු වේ.
4. සම්පත් අධි උපයෝජනය වී ආර්ථික වෘද්ධිය වේගවත් වේ.
5. සම්පත් අධි උපයෝජනය වී අකාර්යක්ෂම නිමැවුමක් බිහි වේ.

(............)

05. ගිෆන් භාණ්ඩයක් සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශන අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

| මිල වෙනස් වීම | ආදේශන ප්‍රතිවිපාකය | ආදායම් ප්‍රතිවිපාකය | මිල ප්‍රතිවිපාකය |
|---|---|---|---|
| 1. මිල ඉහළ යාම | සෘණ | ධන | සෘණ |
| 2. මිල පහළ යාම | සෘණ | සෘණ | සෘණ |
| 3. මිල පහළ යාම | සෘණ | ධන | සෘණ |
| 4. මිල පහළ යාම | සෘණ | සෘණ | ධන |
| 5. මිල ඉහළ යාම | ධන | සෘණ | සෘණ |


(............)

06. ඩීසල් ලීටරයක මිල කිසියම් අනුපාතයකින් ඉහළ යන විට එහි ඉල්ලුම් ප්‍රමාණය එම අනුපාතයෙන්ම අඩුවනු ඇතැයි සිතන්න. වෙළෙඳපොළ මිල ඩීසල් ලීටරයක් රුපියල් 120 දී ඉල්ලුම් ප්‍රමාණය ලීටර් 1000 ක් වනු ඇත. ඉල්ලුම් ප්‍රමාණය 800 ක් වනුයේ ඩීසල් ලීටරයක මිල කොපමණ වන විට දී ද?

1. රු. 100 යි
2. රු. 144 යි
3. රු. 150 යි
4. රු. 152.50 යි
5. රු. 160 යි

(............)

07. එක්තරා භාණ්ඩයක් සඳහා වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත රූප සටහනෙහි දැක්වේ.



සමතුලිත ප්‍රමාණය මිලදී ගැනීම සඳහා පාරිභෝගිකයන් විසින් ගෙවීමට කැමති මුළු මුදල් ප්‍රමාණය රුපියල්,

1. රු. 9 000 යි
2. රු. 8 000 යි
3. රු. 6 000 යි
4. රු. 4 500 යි
5. රු. 2 000 යි

(............)

08. Z භාණ්ඩය බාල භාණ්ඩයකි. පාරිභෝගික ආදායමේ සිදුවන ඉහළ යාමක් නිසා එම භාණ්ඩයෙහි,

1. ඉල්ලුම අඩුවේ. මිල අඩුවේ. ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩුවේ.
2. සැපයුම අඩුවේ. මිල වැඩිවේ. ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩුවේ.
3. ඉල්ලුම අඩුවේ. මිල අඩුවේ. ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩිවේ.
4. ඉල්ලුම වැඩිවේ. මිල අඩුවේ. ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩිවේ.
5. ඉල්ලුම වැඩිවේ. මිල වැඩිවේ. ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩිවේ.

(............)

09. භාණ්ඩයක සැපයුම වැඩි වී ඉල්ලුම අඩුවන විට,

1. සමතුලිත ප්‍රමාණය වැඩිවේ. මිල වෙනස්වන ආකාරය අවිනිශ්චිතය.
2. සමතුලිත මිල ඉහළ නගියි. සමතුලිත ප්‍රමාණය වෙනස්වන ආකාරය අවිනිශ්චිතය.
3. සමතුලිත ප්‍රමාණය අඩුවේ. මිල වෙනස්වන ආකාරය අවිනිශ්චිතය.
4. සමතුලිත මිලත් සමතුලිත ප්‍රමාණයත් පහළ වැටෙයි.
5. සමතුලිත මිල පහළ වැටෙයි. සමතුලිත ප්‍රමාණය වෙනස්වන ආකාරය අවිනිශ්චිතය.

(............)

10. ශ්‍රී ලංකාවේ සහල් සඳහා පවතින ඉල්ලුමේ මිල නම්‍යතා සංගුණකය සෘණ එකට අඩු අගයක් ගනු ඇතැයි සිතන්න. මෙම තත්ත්වය යටතේ සහල් සැපයුමේ අඩු වීමක් සිදු වුවහොත් පහත සඳහන් කවර ප්‍රතිවිපාකයක් හටගනු ලැබේ ද?

1. සහල් සඳහා වෙළෙඳපොළ අධි සැපයුම් තත්ත්වක් හට ගනියි.
2. මුළු අයභාරය ඉහළ දමමින් මිල පහළ බසියි.
3. මුළු අයභාරය පහළ දමමින් මිල ඉහළ ගනියි.
4. මුළු අයභාරය පහළ දමමින් මිල නොවෙනස්ව පවතියි.
5. මුළු අයභාරය ඉහළ දමමින් මිල ඉහළ නගියි.

(............)

11. ස්මාට් ජංගම දුරකතන සඳහා පාරිභෝගික අභිරුචිය වැඩි වී පාරිභෝගික ඉල්ලුම වැඩි වීමේ ප්‍රතිඵලයක් වශයෙන්,

1. නිෂ්පාදන අතිරික්තය, පාරිභෝගික අතිරික්තය සහ ආර්ථික අතිරික්තය වැඩිවනු ඇත.
2. නිෂ්පාදන අතිරික්තය, පාරිභෝගික අතිරික්තය වැඩි වුවත් ආර්ථික අතිරික්තය වෙනස් නොවනු ඇත.
3. නිෂ්පාදන අතිරික්තය අඩු වී පාරිභෝගික අතිරික්තය වැඩි වී ආර්ථික අතිරික්තය වැඩිවනු ඇත.
4. ආර්ථික අතිරික්තය පහළගොස් නිෂ්පාදන අතිරික්තය සහ පාරිභෝගික අතිරික්තය ඉහළයනු ඇත.
5. පාරිභෝගික අතිරික්තය පහළගොස් නිෂ්පාදන අතිරික්තය ඉහළගොස් ආර්ථික අතිරික්තය ද ඉහළ නංවනු ඇත.

(............)

12. පහත සඳහන් ප්‍රකාශ අතුරින් වඩාත් ම නිවැරදි ප්‍රකාශය කුමක් ද?

1. භාණ්ඩයක වෙළෙඳපොළ මිල ඉහළ යාමක් ඉල්ලුම අඩු වීමට බලපානු ඇත.
2. එක් එක් මිල ගණන් යටතේ මිල දී ගැනීමට කැමති ඒ ඒ ප්‍රමාණය ඉල්ලුම් ප්‍රමාණය ලෙස හඳුන්වනු ඇත.
3. පාරිභෝගික ආදායමේ අඩු වීමක් නිසා ඉල්ලුම් සංකෝචනයක් ඇති වේ.
4. ඉල්ලුම් වක්‍රයක කිසියම් ලක්ෂ්‍යයකින් ඉල්ලුම ඉදිරිපත් වේ.
5. භාණ්ඩයක ඉල්ලුම් ප්‍රමාණයේ වෙනසට හේතු වනුයේ සලකා බලන භාණ්ඩයේ මිල වෙනස් වීමයි.

(............)

13. එක්තරා භාණ්ඩයක් සඳහා පවත්නා සැපයුම අනම්‍ය බවත්, එහි ඉල්ලුම පූර්ණ අනම්‍ය බවත් සලකන්න. මෙම තත්ත්වය යටතේ අදාළ භාණ්ඩය මත නිෂ්පාදන බද්දක් පනවනු ලැබුවහොත් බදු බර,

1. ඉතා විශාල වශයෙන් ගැනුම්කරුවන් දරනු ලබයි.
2. ඉතා විශාල වශයෙන් විකුණුම්කරුවන් විසින් දරනු ලබයි.
3. මුළු මනින්ම ගැනුම්කරුවෝ දරනු ලබයි.
4. මුළු මනින්ම විකුණුම්කරුවෝ දරනු ලබයි.
5. ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් සම සමව දරනු ලබයි.

(.............)

14. සමතුලිත මිලට වඩා ඉහළ මිලක් නියම කරමින් පනවනු ලබන අවම මිල ප්‍රතිපත්තියක ප්‍රතිඵලයක් වනුයේ වෙළෙඳපොළෙහි,

1. අධි සැපයුමක් හට ගැනීමය.
2. අධි ඉල්ලුමක් හට ගැනීමය.
3. සමතුලිත මිලක් ඇති වීමය.
4. සැපයුම වැඩි වීමය.
5. ඉල්ලුම අඩු වීමය.


(.............)

15. එක්තරා පාරිභෝගික භාණ්ඩයක් සඳහා සාමාන්‍ය වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පවතීයයි උපකල්පනය කරන්න. මෙම භාණ්ඩයට ඒකක සහනාධාරයක් ලබාදීම නිසා,

| | පාරිභෝගික අතිරික්තය | නිෂ්පාදන අතිරික්තය | සමාජ ශුභ සාධනය |
|---|---|---|---|
| 1. | වැඩි වේ | වැඩි වේ | වැඩි වේ |
| 2. | අඩු වේ | වැඩි වේ | අඩු වේ |
| 3. | අඩු වේ | අඩු වේ | අඩු වේ |
| 4. | වැඩි වේ | වැඩි වේ | අඩු වේ |
| 5. | වැඩි වේ | වැඩි වේ | වෙනස් නොවේ |

(.............)

16. අවම මිල සහතික මිලක් සේ සලකමින් සිදුකරන ඌණපූරණ ගෙවීමේ ක්‍රමය පහත රූප සටහනෙන් දැක්වේ.




ප්‍රස්තාර සටහනේ දැක්වෙන තොරතුරු ඇසුරින් ඌනපූරණ ගෙවීමෙන් පසු නිවැරදි පිළිතුරු කාණ්ඩය වන්නේ,

| | පාරිභෝගික අතිරික්තයේ වැඩි වීම | නිෂ්පාදන අතිරික්තයේ වැඩි වීම | පාරිභෝගික පැහැදම |
|---|---|---|---|
| 1. | A + B | C + D | D + E + H |
| 2. | A + B + C + F + G | B + C + D + J | B + C + F + G + J + K |
| 3. | F + G | J | K |
| 4. | C + F + G | B + J | D + E + H |
| 5. | B | C | D + E |

(.............)

17. ගොඩනැගිලි යන්ත්‍ර සූත්‍ර යොදා ගනිමින් ශ්‍රමය අමු ද්‍රව්‍ය වැනි සාධක වැඩිකරමින් නිෂ්පාදනයේ යෙදෙන නිෂ්පාදන ආයතනයක යම් නිමැවුම් මට්ටමකින් පසු,

1. හීනවන පරිමාණුකූල ඵල ඇති වේ.
2. හීනවන ආන්තික ඵල ඇති වේ.
3. වැඩෙන පරිමාණුකූල ඵල ඇති වේ.
4. ස්ථාවර පරිමාණුකූල ඵල ඇති වේ.
5. කෙටිකාලීන පිරිමැසුම් ඇත වේ.

(.............)

18. ව්‍යාපාර ආයතනයක X භාණ්ඩ 10 ක් නිපදවීමේ සාමාන්‍ය මුලු පිරිවැය (ඒකකයකට) රු.500 කි. X භාණ්ඩ ඒකක 10 සිට 11 දක්වා වැඩි වුවහොත් එක් අතිරේක ඒකකයක සාමාන්‍ය ස්ථාවර පිරිවැය රු.10 කින් ද සාමාන්‍ය විචල්‍ය පිරිවැය රු.10 කින් ද අඩු වේ. X භාණ්ඩ ඒකකයක ආන්තික පිරිවැය,

1. රු. 10
2. රු. 20
3. රු. 280
4. රු. 380
5. රු. 420

(.............)

19. ආයතනයක් පූර්ණ තරඟකාරී වෙළෙඳපොළක කටයුතු කරයි. එම ආයතනය තම භාණ්ඩයේ මිල 5% කින් වැඩි කරයි නම් ආයතනයේ මුලු අයභාරය මත කවර බලපෑමක් ඇති කරනු ලබන්නේ ද?

1. මුලු අයභාරය වෙනස් නොවෙයි.
2. මුලු අයභාරය 5% කින් ඉහළ යයි.
3. මුලු අයභාරය 5% කට වඩා අඩු ප්‍රමාණයකින් ඉහළ යයි.
4. මුලු අයභාරය ශූන්‍ය වෙයි.
5. මුලු අයභාරය 5% කට වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ යයි.

(.............)

20. වෙළෙඳපොළේ මිල රු. 24 ක්ව තිබිය දී ආයතනයේ ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමාන වේ. නමුත් එම ආයතනයේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය රු. 28 මට්ටමේ පවතී. මේ තත්ත්වය යටතේ ආයතනය ගත යුතු තාර්කික තීරණය වනුයේ,

1. ආර්ථික ලාභ උපයමින් රැඳී සිටීම.
2. පාඩු සහිත ව නිෂ්පාදනයේ යෙදී සිටීම.
3. ආර්ථික ලාභ ශූන්‍ය මට්ටමේ පවත්වා ගෙනයාම.
4. නිෂ්පාදනය අත්හිටු වීමට තීරණය කිරීම.
5. ව්‍යාපාර ආයතනයේ ධාරිතාව පුළුල් කිරීමට තීරණය කිරීම.

(.............)

21. පහත සඳහන් ප්‍රකාශ අතුරින් ඔබට එකඟවිය නොහැකි ප්‍රකාශය වනුයේ,

1. සාධක වල පවත්නා ඉල්ලුම භාණ්ඩවලට ඇති ඉල්ලුමෙන් ව්‍යුත්පන්න වන්නකි.
2. යම් සාධකයක් වෙනත් විකල්ප වලට මාරු නොවී පවත්නා පරිහරණයේ රඳවා ගැනීමට එම සාධකයට කළ යුතු අවම ගෙවීම සංක්‍රාම ඉපයුම් වෙයි.
3. යම් සාධකයක් වෙනත් විකල්පයකට මාරු නොවී පවත්නා පරිහරණයේ රඳවා ගැනීමට එම සාධකයට කළ යුතු අවම ගෙවීම ආර්ථික බදුකුලිය වේ.
4. කතිපයාධිකාරී වෙළෙඳපොළ තත්ත්වය තුළ මිල දැඩියාවක් පවතී.
5. යම් සාධකයක සැපයුම පූර්ණ නම්‍ය නම් එම සාධකයෙහි පැවැත්මට යම් මිලක් අනිවාර්යයෙන් අපේක්ෂා කරයි.

(.............)

22. ඒකාධිකාරී වෙළෙඳපොළක දැකගත හැකි ලක්ෂණයක් වන්නේ කුමක් ද?
1. ආයතනය හා කර්මාන්ත්‍ය අතර වෙනසක් නැත.
2. මිල භාර ගන්නෙකු ලෙස කටයුතු කරයි.
3. සමීප ආදේශන බහුලව පවතී.
4. ප්‍රවේශයට බාධාවක් නොමැත.
5. මිල සෑම විටම ආන්තික පිරිවැයට සමාන වෙයි.

(.............)

23. පහත සඳහන් ප්‍රකාශ අතුරින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. නිෂ්පාදනය කරන ලද භාණ්ඩ සහ සේවාවල මූල්‍යමය වටිනාකම්වල එකතුව නිමවුමේ දළ වටිනාකම ලෙස සැලකේ.
2. නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා පිටතින් ලබා ගන්නා භාණ්ඩ සහ සේවා අතරමැදි පරිභෝජනය ලෙස හඳුන්වයි.
3. ප්‍රාථමික යෙදවුම් ලෙස සැලකෙනුයේ නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගැනෙන නිෂ්පාදන සාධක වේ.
4. නිමවුමේ දළ වටිනාකමින් ප්‍රාථමික යෙදවුම් වල වටිනාකම අඩු කළ විට දළ එකතු කළ අගය ලැබෙනු ඇත.
5. දළ එකතු කළ අගය යනු නිෂ්පාදන ක්‍රියාවලියේ දී අලුතින් ජනනය කෙරෙන වටිනාකමය.

(............)

24. පහත සඳහන් ප්‍රකාශ අතුරින් ඔබට එකඟවිය හැකි ප්‍රකාශය තෝරන්න.

1. රටක දේශීය ඉතුරුම් පෞද්ගලික ඉතුරුම් සහ ශුද්ධ අපනයන වලින් සමන්විත වේ.
2. වැය කළ හැකි පෞද්ගලික ආදායමින් පෞද්ගලික පරිභෝජන වියදම අඩු කළ විට දේශීය ඉතිරි කිරීම් ලැබෙනු ඇත.
3. දළ දේශීය ප්‍රාග්ධන වියදමට ශුද්ධ අපනයන එකතු කළ විට මුළු දේශීය ඉතුරුම් පරිමාව ලැබෙනු ඇත.
4. වැය කළ හැකි දළ ජාතික ආදායමින් දළ දේශීය ප්‍රාග්ධන සම්පාදන වියදම අඩු කිරීමෙන් ජාතික ඉතුරුම් ගණනය කරනු ඇත.
5. දළ දේශීය නිෂ්පාදිතයට ශුද්ධ විදේශීය වර්තන සංක්‍රාම ගැලපීමෙන් දේශීය ඉතිරිකිරීම් ගණනය කරයි.

(............)

25. රටක දළ දේශීය නිෂ්පාදිතයට පහත සඳහන් දෑ අතරින් කවරක් ඇතුලත් කෙරේ ද?

1. විශ්‍රාමික සේවකයෙක් උපයන විශ්‍රාම වැටුප
2. පාවිච්චි කළ මෝටර්රථ ආශ්‍රිත වෙළෙඳාමේ වටිනාකම
3. කුටුම්භයක් තුළ කුටුම්භ සාමාජිකයින් විසින් ඉටු කරනු ලබන සේවා වටිනාකම
4. නිවසේ ආහාර පිළියෙල කිරීම සහ ඒවා පිළිගැන්වීම
5. වැටුප් ලබන ගෘහ සේවකයන් විසින් ඉටු කරනු ලබන ගෘහ සේවාව

(............)

26. ආර්ථිකයක් පිළිබඳ කල්පිත දත්ත පහත දැක්වේ. (වටිනාකම රුපියල් මිලියන වලිනි)

| | | |
|---|---|---|
| පෞද්ගලික පරිභෝජන වියදම | = | 5 000 |
| රාජ්‍ය පරිභෝජන වියදම | = | 1 500 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | = | 3 500 |
| තොග පරිලේඛණ වෙනස් වීම් | = | 100 |
| ශුද්ධ අපනයන | = | - 500 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජන වියදම | = | 200 |

මෙම ආර්ථිකයේ දේශීය නිෂ්පාදිතය (රුපියල් මිලියන වලින්)

1. 9 300
2. 9 400
3. 9 500
4. 9 600
5. 10 000


(............)

27. ආණ්ඩුවේ කටයුතු වලින් තොර ආර්ථිකයක ආයෝජන වියදම් ගුණකයෙහි අගය 10 කි. එම ආර්ථිකයේ ආයෝජන මට්ටම රුපියල් මිලියන 400 කින් වැඩි වුවහොත් පරිභෝජනය කොතරම් ප්‍රමාණයකින් වැඩිවනු ඇතිද? (රුපියල් මිලියන)

1. 2 000
2. 2 400
3. 3 600
4. 4 000
5. 4 600

(............)

28. එක්තරා ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතයට අදාළ තොරතුරු පහත රූප සටහනේ දැක්වේ.




ප්‍රස්ථාර සටහනෙහි රේඛීය පරිභෝජන ශ්‍රිතය දැක්වේ. මෙම පරිභෝජන ශ්‍රිතයෙහි ස්වායක්ත පරිභෝජන වියදම 1000 ක් වේ නම් Z ලක්ෂයේ දී මුළු පරිභෝජන වියදම කොපමණ ද? (රුපියල් මිලියන)

1. 14 000
2. 12 400
3. 10 600
4. 9 600
5. 8 400

(.............)

29. කිසියම් ආර්ථිකයක පූර්ණ සේවා නියුක්ති ආදායම් මට්ටම රුපියල් බිලියන 12000 ක් වනු ඇත. ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම් මට්ටම රුපියල් මිලියන 9000 ක් වේ. මෙම ආර්ථිකයේ ආන්තික පරිභෝජන නැඹියාව 0.75 ක් වේ. මෙම ආර්ථිකයට පූර්ණ සේවා නියුක්ති සමතුලිතය සම්පූර්ණ කර ගැනීමට වඩාත් යෝග්‍ය ක්‍රියාමාර්ගය වනුයේ,

1. ආණ්ඩුවේ වියදම රුපියල් මිලියන 3000 කින් ඉහළ නැංවීම.
2. රුපියල් මිලියන 1000 කින් ඍජු බදු වැඩි කිරීම.
3. රුපියල් මිලියන 750 කින් රාජ්‍ය බදු පැනවීම.
4. රුපියල් මිලියන 750 කින් ආයෝජන වියදම් ඉහළ නැංවීම.
5. ආණ්ඩුවේ වියදම් රුපියල් මිලියන 1000 කින් ඉහළ දැමීම.

(.............)

30. පහත සඳහන් මුදල් වර්ග අතුරින් විද්‍යුත් මුදල්වලට අයත් වන්නේ මොනවා ද?

1. පදනම් මුදල් හා ආසන්න මුදල්
2. තැන්පතු සහතික හා භාණ්ඩාගාර බිල්පත්
3. ණයපත් හා හරපත්
4. ඉතුරුම් තැන්පත් හා ස්ථාවර තැන්පත්
5. බැංකු මුදල් හා ව්‍යවහාර මුදල්

(.............)

31. ද්‍රවශීලතාවරණය යනු,

1. කිසියම් වත්කමක් ප්‍රාග්ධන අලාභයකින් තොරව මුදල් බවට පත්කර ගැනීමේ හැකියාවයි.
2. මුදල් ශේෂ ලඟ තබා ගැනීමට මහජනතාව දක්වන කැමැත්තයි.
3. වාණිජ බැංකු මහ බැංකුවේ පවත්වා ගන්නා සංචිත අවශ්‍යතාවයි.
4. වාණිජ බැංකු වත්කම් ව්‍යුහය තුළ පවතින ද්‍රවශීලතා වත්කම් ප්‍රමාණයයි.
5. මහජනතාව අතැති ව්‍යවහාර මුදල් ප්‍රමාණයයි.

(.............)

32. ගණුදෙනු හා ආරක්ෂණ චේතනාවෙන් මුදලට ඇති ඉල්ලුම තීරණය කරන ප්‍රධාන සාධකය වන්නේ,

1. පොළී අනුපාතය
2. මූර්ත ආදායම
3. පිළිණපත් මිල
4. මුදල් සැපයුම
5. පදනම් මුදල්

(.............)

33. පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය පාලනය කිරීම සඳහා යොදාගත හැකි සැපයුම් පාර්ශවීය ප්‍රතිපත්තිය වන්නේ,

1. බදු කපා හැරීම.
2. ශ්‍රමික වැටුප් වැඩි කිරීම.
3. අයවැය හිඟය අඩු කිරීම.
4. වාණිජ බැංකු වලින් ලබා දෙන ණය සීමා කිරීම.
5. පාලන මිල ගණන් නියම කිරීම.

(............)

34. නිරුද්ධමනය යනු,

1. පොදු මිල මට්ටම පහළ බැසීමයි.
2. ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය අඩු වීමයි.
3. පොදු මිල මට්ටම් ඉහළ යාමේ වේගය අඩු වීමයි.
4. උද්ධමන වේගය ශුන්‍ය වීමයි.
5. මාසික උද්ධමන වේගය 10% ට වඩා වැඩි වීමයි.

(............)

35. උද්ධමනාත්මක <u>නිමැවුම් පරතරය</u> යනු,

1. සැබෑ නිමවුම විභව නිමවුමට වඩා අඩු වීමෙන් හටගන්නා ඍණ නිමැවුම් පරතරයයි.
2. සැබෑ නිමවුම විභව නිමවුම ඉක්මවා යාමෙන් හටගන්නා ධනාත්මක නිමවුම් පරතරයයි.
3. පූර්ණ සේවා නියුක්ති මට්ටම ඉක්මවා ඉහළ යන සමාහාර වියදම් මට්ටමයි.
4. පූර්ණ සේවා නියුක්ති මට්ටමට අඩුවෙන් පවතින සමාහාර වියදම් මට්ටමයි.
5. පූර්ණ සේවා නියුක්ති මට්ටමට සමාන වූ සැබෑ නිමවුම් මට්ටමක් බිහි වීමයි.

(............)

36. වාණිජ බැංකුවක මූලික හා ප්‍රාථමික කාර්යය වන්නේ,

1. චෙක්පත් මඟින් ගණුදෙනු කළ හැකි ඉල්ලුම් තැන්පතු භාරගැනීමයි.
2. තැන්පතු භාරගැනීම හා මුදල් ණයට දීමයි.
3. නියෝජිත සේවා සැපයීමයි.
4. පොදු උපයෝගීතා සේවා සැපයීමයි.
5. ණය දීමෙන් මුදල් මැවීමයි.

(............)

37. මුදල් නීති පනත අනුව ලංකාවේ වාණිජ බැංකුවක් පවත්වා ගත යුතු අවම ද්‍රවශීල වත්කම් අනුපාතය වන්නේ,

1. සියයට හතකි. (7%)
2. සියයට දහයකි. (10%)
3. සියයට දොළහකි. (12%)
4. සියයට විස්සකි. (20%)
5. සියයට තිස්හයකි. (36%)

(............)

38. ගැලපීම් වලින් පසු අවසාන මූල්‍ය තත්ත්වය පෙන්නුම් කරන බැංකු පද්ධතියේ ඒකාබද්ධ ශේෂ පත්‍රයක් මතු දැක්වේ.

බැංකු පද්ධතියේ ශේෂ පත්‍රය (රු.මිලියන)

| වගකීම් | | වත්කම් | |
|---|---|---|---|
| තැන්පතු | 10 000 | සංචිත | 1 000 |
| | | ණය | 9 000 |
| එකතුව | 10 000 | එකතුව | 10 000 |

ඉහත තත්ත්වය අනුව ආරම්භක වාණිජ බැංකුවේ පැවතිය හැකි අධි සංචිත ප්‍රමාණය වන්නේ,

1. රුපියල් මිලියන 100 කි.
2. රුපියල් මිලියන 900 කි.
3. රුපියල් මිලියන 1000 කි.
4. රුපියල් මිලියන 1100 කි.
5. රුපියල් මිලියන 2000 කි.

(............)

39. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යයක් නොවන්නේ කුමක් ද?

1. මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙය වීම.
2. ශ්‍රී ලංකාවේ නිල ජාත්‍යන්තර සංචිත කළමනාකරණය කිරීම.
3. බැංකුවල බැංකුකරු ලෙස ක්‍රියාකිරීම.
4. රාජ්‍ය ණය කළමනාකරණය.
5. ව්‍යවහාර මුදල් නිකුත් කිරීම.

(............)

40. මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත් විවෘත වෙළෙඳපොළෙන් මිල දී ගනු ලැබුවහොත් එහි ප්‍රතිඵලයක් වශයෙන් පහත සඳහන් දෑ අතුරෙන් කවරක් සිදුවෙතැයි අපේක්ෂා කෙරේ ද?

1. ණය සඳහා අයකරන පොළී අනුපාතිකය පහළ යාම.
2. මූර්ත දළ දේශීය නිෂ්පාදිතය පහළ යාම.
3. ආර්ථිකයේ මුදල් සැපයුම සංකෝචනය වීම.
4. පෞද්ගලික අංශයේ ආයෝජන අඩාල වීම.
5. බැංකු විසින් සපයනු ලබන ණය ප්‍රමාණය අඩු විම.

(............)

41. පහත සඳහන් දෑ අතරින් අර්ධ පොදු භාණ්ඩ වන්නේ,

1. නිවාස හා පරිගණක
2. පිරිසිදු වාතය හා ඛනිජ තෙල් නිධි
3. නීතිය හා මාර්ග සංඥා
4. පුස්තකාල හා කෞතුකාගාර
5. ප්‍රදීපාගාර සහ ආලෝක සංඥා

(............)

42. ශුභ සාධන භාණ්ඩවල දැකිය හැකි සුවිශේෂ ලක්ෂණය වන්නේ,

1. පරිභෝජනය තරඟකාරී වීම.
2. පරිභෝජනය සීමාකළ හැකි වීම.
3. පෞද්ගලික ප්‍රතිලාභ ඉක්ම වූ සමාජ ප්‍රතිලාභ පැවතීම.
4. පරිභෝජනය තරඟකාරී නොවීම.
5. ඉතා විශාල සමාජ පිරිවැයක් සහිත වීම.

(............)

43. වෙළෙඳපොළ කාර්යක්ෂම නිමවුම ඉක්ම වූ අධි නිෂ්පාදනයක් බිහිවිය හැක්කේ,

1. පරිභෝජනයේ සහ නිෂ්පාදනයේ ධන බාහිරතා පවතින විට
2. පරිභෝජනයේ සහ නිෂ්පාදනයේ ඍණ බාහිරතා පවතින විට
3. පරිභෝජනයේ ධන බාහිරතා සහ නිෂ්පාදනයේ ඍණ බාහිරතා පවතින විට
4. නිෂ්පාදනයේ ධන බාහිරතා සහ පරිභෝජනයේ ඍණ බාහිරතා පවතින විට
5. ආන්තික පෞද්ගලික පිරිවැය ආන්තික සමාජ පිරිවැයට සමාන වන විට

(............)

44. ව්‍යවස්ථාපිත බදු ආපාතයෙන් දැක්වෙන්නේ,

1. බදු බර පාරිභෝගිකයා හා නිෂ්පාදකයා අතර බෙදී යන ආකාරයයි.
2. පාරිභෝගික බදු බරයි.
3. නිෂ්පාදන බදු බරයි.
4. බද්දක් විතැන් කිරීමේ හැකියාවක් ඇත් ද? යන්නයි.
5. නෛතික වශයෙන් රජයට බදු ගෙවන්නේ කවුරුන් ද? යන්නයි.

(............)

45. ශ්‍රී ලංකාවේ බදු ව්‍යුහය තුළ වැඩි ම ආදායමක් ලබා දෙන බදු වර්ග වන්නේ,

1. නිෂ්පාදන බදු සහ ආදායම් බදු
2. නිෂ්පාදන බදු සහ එකතු කල අගය මතබදු
3. ආදායම් බදු සහ ආනයන බදු
4. ආදායම් බදු සහ එකතු කල අගය මත බදු
5. නිෂ්පාදන බදු සහ ආනයන බදු

(............)

46. ශ්‍රී ලංකාවේ මෑත කාලීන වර්තන වියදම් ව්‍යුහය තුළ වැඩිම වියදමක් දැරීමට සිදු වන තනි අයිතමය වන්නේ,

1. වැටුප් හා වේතන සඳහා දරන වියදම්
2. විශ්‍රාම වැටුප් සඳහා දරන වියදම්
3. රාජ්‍ය ණය පොළී ගෙවීම් සඳහා දරන වියදම්
4. මූර්ත වත්කම් අත්පත් කර ගැනීමට දරන වියදම්
5. ශුද්ධ ණය දීම් සඳහා දරන වියදම්

(............)

47. අයවැය හිඟය පියවීමේ දී යොදා ගන්නා ණය සේවාකරණ ගෙවීම් කෙරෙහි බලපෑමක් ඇති නොවන මූලාශ්‍රය වන්නේ,

1. විදේශ ප්‍රදාන
2. විදේශ ආධාර
3. වාණිජ ණය
4. බැංකු නොවන වෙළෙඳපොළ ණය
5. බහු පාර්ශවීය ණය

(............)

48. පහත සඳහන් ක්‍රියාමාර්ග අතරින් ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියකට අනුකූල වන ක්‍රියාමාර්ගය කුමක් ද?

1. මහ බැංකුව වාණිජ බැංකු වලින් භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම.
2. වාණිජ බැංකු වලින් ආර්ථිකයට සැපයෙන ණය ප්‍රසාරණය කිරීම.
3. රජය කුටුම්භ සහනාධාර වියදම් ඉහළ නැංවීම හා වැටුප් වැඩි කිරීම.
4. බදු අනුපාත ඉහළ නැංවීම හා ප්‍රාග්ධන වියදම් කපා හැරීම.
5. මහ බැංකුව ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා වැඩි කිරීම.

(............)

49. පහත සංඛ්‍යා සටහනින් දැක්වෙන්නේ බයිසිකල් හා ඇගලුම් ඒකක එක බැගින් නිෂ්පාදනය කිරීමට ඉන්දියාවට හා ශ්‍රී ලංකාවට වැය කළ යුතු වන ශ්‍රම දින ගණන්ය.

| | ශ්‍රී ලංකාව | ඉන්දියාව |
|---|---|---|
| බයිසිකල් | 80 | 48 |
| ඇගලුම් | 16 | 12 |

මෙම තත්ත්වය යටතේ විදේශීය වෙළෙඳාමට පිවිසිය හොත්,

1. ශ්‍රී ලංකාව ඇගලුම් හා ඉන්දියාව බයිසිකල් අපනයනය සඳහා සූදානම් වීම දෙරටටම වාසි ගෙන දෙයි.
2. ශ්‍රී ලංකාව ඇගලුම් හා ඉන්දියාව බයිසිකල් ආනයනය කිරීමට සූදානම් වීම දෙරටටම වාසි ගෙන දෙයි.
3. ශ්‍රී ලංකාවට කිසිම භාණ්ඩයකින් සාපේක්ෂ වාසි නොපවතින නිසා පාඩු සිදු වෙයි.
4. දෙරට අතර මෙම භාණ්ඩ දෙක අතර වෙළෙඳාමක් බිහි වීමකට කිසිදු පදනමක් නැති නිසා දෙරටටම අවාසි ගෙන දෙයි.
5. නිරපේක්ෂ වාසිය යටතේ පමණක් වෙළෙඳාමට පදනමක් සැකසෙයි.

(............)

50. යම් දෙන ලද කාලපරිච්ඡේදයක් තුළ අපනයන මිල 20% කින් ඉහළ ගොස් ආනයන මිල 60% කින් ඉහළ ගියේ නම් වෙළෙඳ අනුපාතය,

1. 16% කින් යහපත් වෙයි.
2. 20% කින් යහපත් වෙයි.
3. 25% කින් යහපත් වෙයි.
4. 40% කින් අයහපත් වෙයි.
5. 25% කින් අයහපත් වෙයි.

(............)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු**

**General Certificate of Education (Adv. Level), Grade 13, Second Term Test, March 2020**

**ආර්ථික විද්‍යාව - II**
**Economics - II**

**21 | S | II**

**පැය 03 යි විනාඩි 10**
**Time:03hr & 10mts**

විභාග අංකය : ......................................................................

**උපදෙස් :**

- **'අ' කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද 'ආ' කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

## 'අ' කොටස

01. i. ශ්‍රමය හා මානව ප්‍රාග්ධනය හඳුන්වා ඒ අතර පවතින වෙනස්කම් පැහැදිළි කරන්න. (ලකුණු 04)

ii. ආර්ථිකයක් සතු සම්පත් සම්භාරය ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනය සඳහා වැඩි ප්‍රමාණයක් ද පරිභෝජන භාණ්ඩ නිෂ්පාදනය සඳහා අඩු ප්‍රමාණයක් ද උපයෝජනය කිරීමෙන් බිහිවිය හැකි වර්තමාන හා අනාගත ආර්ථික ප්‍රතිවිපාක පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. ඉතුරුම් ආයෝජනය හා ප්‍රාග්ධනය යන සංකල්ප හඳුන්වා ඒ අතර පවතින සම්බන්ධතාව දක්වන්න. (ලකුණු 04)

iv. නිෂ්පාදනය පිළිබඳ ගැටළුව හඳුන්වන්න.
වෙළෙඳපොළ ආර්ථිකයක් එම ගැටළුව විසඳා ගැනීමට කටයුතු කරන්නේ කෙසේ ද? (ලකුණු 04)

v. මිලෙහි කාර්යයන් අතරින් තීරණ ගන්නා ඒකක වලට සංඥා සැපයීම හා සළාකකරණය යන කාර්යයන් පැහැදිළි කරන්න. (ලකුණු 04)

02. i. ඉල්ලුම් ප්‍රසාරණය සහ ඉල්ලුම අඩුවීම එකිනෙක ප්‍රතිවිරුද්ධ සංකල්ප දෙකකි. ඔබ පිළිගන්නෙහි ද? පැහැදිළි කරන්න. (ලකුණු 04)

ii. භාණ්ඩයක සැපයුමේ මිල නම්‍යතාවය ගණනය කළවිට ධන එකට අඩු අගයක්, ධන එකට වැඩි අගයක් ලෙස පිහිටනු ඇත. එසේ වීමට හේතු පැහැදිළි කරන්න. (ලකුණු 04)

iii. ''කුටුම්භයක ආදායම 40% කින් වැඩිවන විට අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සඳහා පවතින ඉල්ලුම 40% කින් වැඩි වේ.'' අදාළ ආර්ථික විද්‍යා සංකල්පය යොදා ගනිමින් ඉහත ප්‍රකාශය තහවුරු කරන්න. (ලකුණු 04)

iv. 'පාරිභෝගික අතිරික්තය' 'නිෂ්පාදන අතිරික්තය' යන සංකල්ප රූප සටහනක් භාවිතා කරමින් පැහැදිළි කරන්න. (ලකුණු 04)

v. තරඟකාරී වෙළෙඳපොළක අලෙවි වන එක්තරා භාණ්ඩයක ඉල්ලුම් සැපයුම් වක්‍ර සරල රේඛීය වේ. භාණ්ඩයේ වෙළෙඳපොළ තොරතුරු පහත දැක්වේ.

| මිල (රුපියල්) | අධි ඉල්ලුම් ප්‍රමාණය (ඒකක) |
|---|---|
| 60<br>120 | 1600<br>-800 |

අ) ප්‍රස්තාර සටහනක් නිර්මාණය කර සමතුලිත මිල ඉදිරිපත් කරන්න. (ලකුණු 02)

ආ) සෑම මිලකදී ඉල්ලුම් ප්‍රමාණය ඒකක 400 බැගින් වැඩි වන්නේ නම් නව සමතුලිත මිල දක්වන්න. (ලකුණු 02)

03. i. තරඟකාරී වෙළෙඳපොළක ගැනුම්කරුවන්ගේ හා විකුණුම්කරුවන්ගේ අපේක්ෂාවන් තුලනය වීම වෙළෙඳපොළ සමතුලිතයක දී සිදුවුවත් වෙළෙඳපොළට රජය මැදිහත් වන්නේ ඇයි දැයි සඳහන් කොට මෙලෙස වෙළෙඳපොළට රජය මැදිහත් වන ප්‍රධාන ආකාර හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

ii. වෙළෙඳපොළ මිල යන්ත්‍රය යටතේ තීරණය වූ සහල් මිල පාරිභෝගිකයාට අසාධාරණ වෙතැයි සිතූ ආණ්ඩුව සහල් සඳහා උපරිම මිලක් නියම කළේ යැයි සිතන්න. මෙම තත්ත්වය රූප සටහනක පෙන්වා ඒ තුළින් හටගත හැකි ප්‍රතිවිපාක සඳහන් කරන්න. (ලකුණු 04)

iii. නිදහස් තරඟකාරී වෙළෙඳපොළකට අදාළ ඉල්ලුම් හා සැපයුම් සමීකරණ මතු දැක්වේ.

$Qd = 100 - 10p$ (ඉල්ලුම් සමීකරණ) $Qs = -20 + 20p$ (සැපයුම් සමීකරණ)

නිෂ්පාදකයින්ට සාධාරණයක් ඉටුකිරීම සඳහා මිල රුපියල් 6.00 සහතික මිලක් ලෙස නියම කරනු ලැබීය.

අ) සහතික මිල යටතේ පාරිභෝගිකයන් මිල දී ගනු ලබන ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 02)

ආ) සහතික මිල යටතේ වෙළෙඳපොළ තුළ බිහිවන අතිරික්ත සැපයුම හා එම අතිරික්ත සැපයුම මිල දී ගැනීම සඳහා රජයට දැරීමට සිදුවන පිරිවැය කොපමණ ද? (ලකුණු 02)

ඉ) රජය මිල දී ගත් අතිරික්තය සම්බන්ධයෙන් අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

ඊ) සහතික මිල යටතේ රජය අතිරික්තය මිල දී ගැනීමෙන් පසු නිෂ්පාදන අතිරික්තය කොපමණ ද? (ලකුණු 02)

iv. ''භාණ්ඩයත සැපයුම් ප්‍රමාණය ඉහළ ගිය ද නිෂ්පාදකයන්ගේ මුළු අලෙවි ආදායම පහත බැසීමක් වාර්තා වී ඇත.''

අ) මෙවැනි තත්ත්වයක් විශේෂයෙන් හටගන්නේ කිනම් භාණ්ඩ සම්බන්ධයෙන් ද?

ආ) අදාළ භාණ්ඩ සම්බන්ධයෙන් එවැනි තත්ත්යක් හටගැනීම මූලික හේතුව කුමක් ද?

ඉ) මිල ගණන් අස්ථායී වීම වැළැක්වීම සඳහා රජයට ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

04. අ) i. ''ව්‍යාපාර ආයතනයක ගණකාධිකාරී ලාභ ආර්ථික ලාභ වලට වඩා වැඩි වේ.'' පැහැදිලි කරන්න. (ලකුණු 02)

ii. හීනවන ආන්තික ඵල ව්‍යාපාර ආයතනයක ආන්තික පිරිවැය කෙරෙහි සහ හීනවන පරිමාණුකූල ඵල දිගු කාලීන සාමාන්‍ය පිරිවැය කෙරෙහි බලපාන ආකාරය පැහැදිළි කරන්න. (ලකුණු 03)

ආ) i. පූර්ණ තරඟකාරී ආයතනයක් මුහුණ දෙන ඉල්ලුම් වක්‍රයේ හැඩය කවර ස්වරූපයක් ගනු ලබන්නේ ද එසේ වීමට හේතුව ඔබ පැහැදිළි කරන්නේ කෙසේ ද? (ලකුණු 04)

ii. ''පූර්ණ තරඟ ව්‍යාපාර ආයතන ප්‍රාමාණික ලාභ ලබමින් කටයුතු කිරීම සතුටු විය හැකි තත්ත්වයක් මිස අසතුටු විය හැකි තත්ත්වයක් නොවේ.'' පැහැදිළි කරන්න. (ලකුණු 04)

iii. කෙටි කාලයෙහි නිෂ්පාදනයෙහි නිරතව සිටින ආයතනයක මුළු අයභාරය රුපියල් මිලියන 1000 ක් බවත් , මුළු ස්ථාවර පිරිවැය රුපියල් මිලියන 4000 ක් බවත් වාර්තා කරයි. මෙම තත්ත්වය යටතේ එම ආයතනය තව දුරටත් නිෂ්පාදනයේ රැඳී සිටිය යුතු ද? එසේ නම් ඒ ඇයිදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. සාපේක්ෂ වශයෙන් අනම්‍ය සැපයුමක් සහිත සාධකයක සංක්‍රාම ඉපැයුම් සහ ආර්ථික බදුකුලිය රූප සටහනක් මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 03)

05. i. ජාතික ආදායම් සංඛ්‍යා ලේඛණ ප්‍රයෝජනවත් වන්නේ කවර ආකාරයන්ගෙන් ද? (ලකුණු 04)

ii. කල්පිත ආර්ථිකයක් සඳහා පහත සඳහන් දත්ත ඔබ වෙත දී ඇත.

| | | (රුපියල් මිලියන) |
|---|---|---|
| සේවක ආදායම් | = | 4 500 |
| ශුද්ධ මෙහෙයුම් අතිරික්තය | = | 7 000 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය | = | 500 |
| මිශ්‍ර ආදායම් | = | 1 000 |
| නිෂ්පාදනය මත වෙනත් බදු (අඩුකලා එම සහනාධාර) | = | 1 200 |
| නිෂ්පාදිතය මත බදු | = | 1 800 |
| නිෂ්පාදිතය මත සහනාධාර | = | 400 |
| විදේශීය ප්‍රාථමික ආදායම් ලැබීම් | = | 950 |
| විදේශීය ප්‍රාථමික ආදායම් ගෙවීම් | = | 1 450 |
| විදේශීය ජංගම සංක්‍රාම ලැබීම් | = | 2 400 |
| විදේශීය ජංගම සංක්‍රාම ගෙවීම් | = | 600 |
| භාණ්ඩ හා සේවා අපනයන | = | 1 300 |
| භාණ්ඩ හා සේවා ආනයන | = | 2 300 |
| මුළු පරිභෝජන වියදම | = | 12 600 |

ඉහත දත්ත පදනම් කර ගනිමින් පහත සඳහන් දෑ ගණනය කරන්න.

අ) දළ දේශීය නිෂ්පාදිතය (ලකුණු 03)
ආ) දළ ජාතික ආදායම (ලකුණු 02)
ඉ) වැය කළ හැකි දළ ජාතික ආදායම (ලකුණු 02)
ඊ) දළ ජාතික ඉතිරිකිරීම් (ලකුණු 02)
උ) දළ දේශීය ප්‍රාග්ධන සම්පාදන වියදම (ලකුණු 02)

iii. දෙන ලද කාලසීමාවක දී කිසියම් ආර්ථිකයක ආයෝජනය රුපියල් මිලියන 400 කි. රාජ්‍ය මිලදී ගැනීම් රුපියල් මිලියන 300 කි. ශුද්ධ බදු රුපියල් මිලියන 400 කි. ආර්ථිකයේ පරිභෝජන ශ්‍රිතය $C = 100 + 0.8yd$ වේ.

අ) රාජ්‍ය වියදම් ගුණකය සහ බදු ගුණකය ගණනය කරන්න. (ලකුණු 02)

ආ) මෙම ආර්ථිකයේ පූර්ණ සේවා නියුක්ති ආදායම් මට්ටම 4000 ක් ලෙස පිළිගන්න. පූර්ණ සේවා නියුක්ති මට්ටම කරා ලඟා වීමට ආයෝජන වියදම් කොපමණ වැඩි කළ යුතු ද? නැතිනම් එයට විකල්ප ක්‍රියාමාර්ගයක් ලෙස බදු ආදායම අඩු කරන්නේ නම්, බදු කොපමණ ප්‍රමාණයකින් අඩු කිරීම ප්‍රමාණවත් වේද?

(ලකුණු 03)

## <u>'ආ' කොටස</u>

06\. i. ව්‍යවහාර මුදල් හා ආසන්න මුදල් අතර වෙනස පැහැදිළි කරන්න. (ලකුණු 04)

ii. අ) මුදල් සැපයුම ගණනය කිරීමේ වැදගත්කම කුමක් ද? (ලකුණු 02)

ආ) $M_2b$ ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම තුළ ඇතුළත් ආසන්න මුදල් සංරචක මොනවා ද? (ලකුණු 02)

iii. පහත සඳහන් ක්‍රියාමාර්ග පදනම් මුදල් හා මුදල් සැපයුම කෙරෙහි ඇති කරන බලපෑම කෙටියෙන් පැහැදිළි කරන්න.

අ) මහ බැංකුව ශ්‍රී ලංකාවේ රජයට පරිත්‍යාගයක් ලෙස ලැබුණු ඩොලර් මිලියන 400 ක් මිලදී ගැනීම.

ආ) මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට රුපියල් මිලියන 10 ක භාණ්ඩාගාර බිල්පත් අලෙවි කිරීම.

ඉ) මහ බැංකුව විදේශ විනිමය වෙළෙඳපොළෙහි ඩොලර් 500 ක අලෙවි කිරීම. (ලකුණු 06)

iv. උද්ධමනය පහත සඳහන් පාර්ශව කෙරෙහි ඇති කරන බලපෑම කෙටියෙන් දක්වන්න.

අ) රාජ්‍ය සේවකයන් ආ) ණයගැතියන්
ඉ) විනිමය අනුපාතය ඊ) ඉතිරිකරන්නන් (ලකුණු 04)

v. පොදු මිල මට්ටම මැනීමේ මිනුමක් ලෙස නිෂ්පාදකයාගේ මිල දර්ශකයේ වැදගත්කම කුමක් ද? (ලකුණු 02)

07\. i. මූල්‍ය ආයතන ලෙස ලංකා බැංකුව හා ශ්‍රී ලංකා මහ බැංකුව අතර පවතින ප්‍රධාන වෙනස්කම් මොනවා ද? (ලකුණු 04)

ii. බැංකු තැන්පතු ප්‍රසාරණ සංගුණකය යනු කුමක් ද? එහි අගය තීරණය වන්නේ කෙසේ දැයි නිදසුනක් ඇසුරින් පැහැදිළි කරන්න. (ලකුණු 04)

iii. කිසියම් කල්පිත ආර්ථිකයක වාණිජ බැංකු පද්ධතිය තුළ කටයුතු කරන එක් වාණිජ බැංකුවල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ශේෂ පත්‍රය) පහත දැක්වේ. (සංඛ්‍යා රුපියල් මිලියන වලිනි)

| වගකීම් | | වත්කම් | |
|---|---|---|---|
| තැන්පතු | 200 000 | සංචිත | 30 000 |
| කොටස් ප්‍රාග්ධනය | 50 000 | සුරැකුම්පත් | 60 000 |
| | | ණය | 160 000 |
| එකතුව | 250 000 | එකතුව | 250 000 |

අ) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10% ක් නම් මෙම බැංකුව සතුව අධි සංචිත තිබේද? එසේ නම් එය කොපමණ ද? (ලකුණු 02)

ආ) මෙම බැංකුවට අළුතින් ලබාදිය හැකි උපරිම ණය ප්‍රමාණය ලබාදුනහොත් බැංකුවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය වෙනස්වන්නේ කෙසේ දැයි පෙන්වන්න. (ලකුණු 02)

iv. විවට වෙළෙඳපොළ කටයුතු (Open Market Operations) යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? ඒ තුලින් මහ බැංකුව ඉටුකර ගැනීමට අපේක්ෂිත පරමාර්ථ සඳහන් කොට එම පරමාර්ථ ඉටුකර ගැනීමේ හැකියාව සීමා කෙරෙන ප්‍රධාන සාධක වෙන වෙනම සඳහන් කරන්න. (ලකුණු 04)

v. ''ආර්ථිකයේ මුදල් සැපයුමේ හටගන්නා සැබෑ ප්‍රසාරණය බැංකු තැන්පතු ප්‍රසාරණ සංගුණකයෙහි දැක්වෙන ප්‍රමාණයට වඩා වෙනස්විය හැකිය.'' ඒ අනුව වාණිජ බැංකු පද්ධතියක මුදල් මැවීම සීමාවිය හැකි සාධක හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

08. i. වෙළෙඳපොළ අසමත් වීමට හේතුවන ආදායම් ව්‍යාප්තියේ විෂමතාව අවම කර ගැනීමට ආණ්ඩුව විසින් ගනු ලබන ක්‍රියාමාර්ග මොනවා ද? (ලකුණු 04)

ii. ''පාසල් ළමුන්ට අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා රජය විසින් නොමිලේ නිල ඇඳුම් වවුචර් ලබා දීමේ වැඩසටහන් ක්‍රියාවට නංවා ඇත.''
මෙම වැඩසටහන සමාජීය ප්‍රශස්ථ නිමවුමට හා වෙළෙඳපොළ කාර්යක්ෂම නිමවුමට ඇති කෙරෙන බලපෑම ප්‍රස්ථාර සටහනක් ඇසුරින් පැහැදිළි කරන්න. (ලකුණු 04)

iii. රාජ්‍ය අයවැය සම්බන්ධයෙන් පහත සඳහන් මිනුම් හඳුන්වා ඒවායේ වැදගත්කම දක්වන්න.

අ) වර්තන ගිණුමේ ශේෂය ආ) ප්‍රාථමික ශේෂය
ඉ) සමස්ථ ශේෂය (ලකුණු 06)

iv. ''ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ක්ෂේත්‍රයේ පවතින ප්‍රධාන ගැටළුවක් වන්නේ රාජ්‍ය ණය ඉහළ මට්ටමක පැවතීමයි.''
2018 වර්ෂයේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය වල ස්වභාවය හා ප්‍රමාණය රාජ්‍ය ණය හා සම්බන්ධ මිනුම් ඇසුරින් දක්වන්න. (ලකුණු 02)

v. අ) මෑත කාලීනව ශ්‍රී ලංකාවේ අයවැය හිඟය පියවා ගැනීමට යොදාගත් මූලාශ්‍ර මොනවා ද? (ලකුණු 02)
ආ) එම මූලාශ්‍ර භාවිතා කිරීමෙන් බිහිවන ආර්ථික ප්‍රතිවිපාක මොනවා ද? (ලකුණු 02)

09. අ) A සහ B යන රටවල් දෙකට සමාන වූ සම්පත් ප්‍රමාණයකින් නිපදවිය හැකි තිරිඟු සහ රෙදි ඒකක ප්‍රමාණයන් පහත දැක්වේ.

| | A | B |
|---|---|---|
| තිරිඟු | 18 | 20 |
| රෙදි | 6 | 20 |

i. භාණ්ඩ දෙවර්ගයම නිපදවීමේ නිරපේක්ෂ වාසි ඇති රට කුමක් ද? (ලකුණු 02)

ii. A සහ B රටවලට සාපේක්ෂ වාසිය ඇති භාණ්ඩ කවරේ ද? ගණන් බලන්න. (ලකුණු 02)

iii. රටවල් දෙකෙහි අභ්‍යන්තර හුවමාරු අනුපාතයන් අතර අතරමැදි හුවමාරු වෙළෙඳ අනුපාතය (ජාත්‍යන්තර හුවමාරු අනුපාතය) රෙදි ඒකකයට තිරිඟු ඒකක 2 ක් නම් ,

a. විශේෂීකරණය යටතේ වෙළෙඳාම තුළින් A රටට රෙදි ඒකකයක් ලබා ගැනීමට හුවමාරු කළ යුතු තිරිඟු ඒකක ප්‍රමාණය කොපමණ ද?
b. වෙළෙඳාමක් නොමැති නම් A රටට රෙදි ඒකකයක් ලබා ගැනීමට කැප කළ යුතු තිරිඟු ඒකක ප්‍රමාණය කොපමණ ද?
c. වෙළෙඳාමක් නොමැති නම් B රටට තිරිඟු ඒකකයක් ලබා ගැනීමට කැප කළ යුතු රෙදි ඒකක ප්‍රමාණය කොපමණ ද?
d. විශේෂීකරණය යටතේ වෙළෙඳාම සිදුවන විට B රටට තිරිඟු ඒකකයකට හුවමාරු විය යුතු රෙදි ඒකක ප්‍රමාණය කොපමණ ද?

(කොටසකට ලකුණු 02 බැගිනි)

ආ) i. සඵල ආරක්ෂණ අනුපාතය, ඉහළ යන්නේ කුමන තත්ත්වයක් යටතේ ද? (ලකුණු 02)

ii. තරඟකාරිත්ව වාසිය යන්න පැහැදිළි කරන්න. තරඟකාරිත්ව වාසියේ මූලාශ්‍ර කවරේ ද? (ලකුණු 03)

iii. නිදහස් වෙළෙඳාම සීමා කෙරෙන තීරුබදු බාධකවලට අමතරව තීරුබදු නොවන බාධක මොනවා ද? (ලකුණු 03)

10. i. ද්විත්ව සටහන් මූලධර්ම යොදා ගනිමින් පහත සඳහන් ගණුදෙනු ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ලේඛනයෙහි ඔබ වාර්තා කරන්නේ කෙසේ ද?

අ) ශ්‍රී ලාංකික සමාගමක් රුපියල් මිලියන 1500 ක වටිනාකමකින්යුත් පරිගණක යන්ත්‍ර ජපන් සමාගමක් වෙතින් ශ්‍රී ලංකාවට ආනයනය කිරීම.

ආ) ශ්‍රී ලංකා රජය චීන රජයෙන් ලබාගත් ණය මුදලක් වෙනුවෙන් ඩොලර් මිලියන 400 ක පොළී ගෙවීම.

ඉ) කොරියන් රජයේ සේවය කරන ශ්‍රී ලාංකිකයින් තම ඥාතීන් වෙත ඩොලර් මිලියන 200 ක් එවීම.

ඊ) ශ්‍රී ලංකාවේ පෞද්ගලික ව්‍යාපාරික ආයතනයක් ජාත්‍යන්තර මූල්‍ය ආයතනයකින් ඩොලර් මිලියන 500 ක මුදලක් ණය වශයෙන් ලබා ගැනීම. (ලකුණු 04)

ii. කල්පිත ආර්ථිකයක කිසියම් වර්ෂයක නේවාසිකයින් හා අනේවාසිකයින් අතර සිදුවන ගණුදෙනු පහත දැක්වේ. (වටිනාකම් රුපියල් මිලියන වලිනි)

| | | |
|---|---|---|
| භාණ්ඩ අපනයන | = | 200 |
| සේවා අපනයන | = | 70 |
| භාණ්ඩ ආනයන | = | 350 |
| සේවා ආනයන | = | 20 |
| ප්‍රාථමික ආදායම් ලැබීම් | = | 110 |
| ප්‍රාථමික ආදායම් ගෙවීම් | = | 135 |
| ද්විතීක ආදායම් ශුද්ධ | = | 40 |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | = | 35 |
| රජයේ සංක්‍රාම ශුද්ධ | = | 15 |
| ප්‍රාග්ධන ගිණුම් ලැබීම් | = | 60 |
| ප්‍රාග්ධන ගිණුම් ගෙවීම් | = | 55 |
| අනෙකුත් ආයෝජන වත්කම් | = | 30 |
| සෘජු ආයෝජන ලැබීම් | = | 45 |

ඉහත දත්ත ආශ්‍රයෙන් පහත සඳහන් දෑ ගණනය කරන්න.

අ) වෙළෙඳ ශේෂය
ආ) ශුද්ධ අපනයන
ඉ) ජංගම ගිණුමේ ශේෂය
ඊ) ජංගම සහ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය (ලකුණු 04)

iii. ගෙවුම් ශේෂයේ සමස්ථ ශේෂයේ හිගයක් දිගු කාලීනව පවතී නම් ඒ සඳහා භාවිතා කෙරෙන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කවරේ ද? (ලකුණු 04)

iv. නාමික විනිමය අනුපාතිකය සඵල විනිමය අනුපාතිකයෙන් වෙනස් වන්නේ කෙසේ ද? (ලකුණු 04)

v. නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය යටතේ ශ්‍රී ලංකා රුපියලේ බාහිර අගය ඇමරිකානු ඩොලර්වලින් තීරණය වන ආකාරය පෙන්නුම් කිරීමට උචිත ප්‍රස්ථාර සටහනක් නිර්මාණය කර එහි වක්‍රවල පිහිටීම පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 04)

## දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### දෙවන වාර විභාගය - 2020

### 13 ශ්‍රේණිය

### ආර්ථික විද්‍යාව පිළිතුරු

### I පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| 01 - 2 | 11 - 1 | 21 - 3 | 31 - 2 | 41 - 4 |
| 02 - 4 | 12 - 5 | 22 - 1 | 32 - 2 | 42 - 3 |
| 03 - 4 | 13 - 3 | 23 - 4 | 33 - 1 | 43 - 2 |
| 04 - 5 | 14 - 1 | 24 - 3 | 34 - 3 | 44 - 5 |
| 05 - 4 | 15 - 4 | 25 - 5 | 35 - 2 | 45 - 2 |
| 06 - 3 | 16 - 4 | 26 - 1 | 36 - 2 | 46 - 3 |
| 07 - 2 | 17 - 2 | 27 - 3 | 37 - 4 | 47 - 1 |
| 08 - 1 | 18 - 3 | 28 - 3 | 38 - 2 | 48 - 3 |
| 09 - 5 | 19 - 4 | 29 - 4 | 39 - 4 | 49 - 1 |
| 10 - 5 | 20 - 4 | 30 - 3 | 40 - 1 | 50 - 5 |

---

### II පත්‍රය

**'අ' කොටස**

01. i. - ශ්‍රමය යනු භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට යොදා ගන්නා කායික හා මානසික ශක්තියයි.
- මානව ප්‍රාග්ධනය යනු ආයෝජන තුළින් නිපුනතාවයට පත්කරන ලද ශ්‍රමයයි.


**(ලකුණු 02)**

- ශ්‍රමය තීරණය වීම කෙරෙහි අධ්‍යාපනය පෝෂණ මට්ටම, සෞඛ්‍යතාවය, ජනගහනය ආදී සාධක බලපානු ලැබේ.
- මානව ප්‍රාග්ධනය ශ්‍රමයට වඩා ඵලදායීතාවයෙන් වැඩිය.
- මානව ප්‍රාග්ධනය තුළ ශ්‍රමය හා ප්‍රාග්ධනය යන සාධක දෙකෙහිම ගුණාංග අන්තර්ගත වේ.

**(ඕනෑම කරුණු 02 කට ලකුණු 02)**

ii. - වර්තමාන පරිභෝජනය අඩු වීම.
- වර්තමාන ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනය වැඩි වීම.
- ජනතාවගේ වර්තමාන ජීවන තත්ත්වය පහත වැටීම.
- අනාගත නිෂ්පාදන හැකියාව ඉහළ ගොස් අනාගත ආර්ථික වෘද්ධිය යහපත් වීම.
- අනාගතයේ ප්‍රාග්ධන භාණ්ඩ මෙන්ම පරිභෝජන භාණ්ඩ නිෂ්පාදන මට්ටම ද ඉහළ යාම.

**(ඕනෑම කරුණු 03 කට ලකුණු 03)**




**(ලකුණු 01)**

iii. - ඉතුරුම් යනු ආදායමෙන් පරිභෝජනය නොකරන කොටස වේ. රටක මුළු ඉතුරුම් දේශීය ඉතුරුම් හා විදේශ ඉතුරුම් යනුවෙන් වර්ග කෙරේ. **(ලකුණු 01)**

- ආයෝජනය යනු රටක පවතින ප්‍රාග්ධන සම්භාරයට අලුතෙන් කරනු ලබන ප්‍රාග්ධන ප්‍රමාණයයි. (ප්‍රාග්ධන භාණ්ඩ බිහිකිරීමේ ක්‍රියාවලියයි)
  ආයෝජනයේ ස්වරූප දෙකකි.
  - නව ප්‍රාග්ධනය අත්පත් කර ගැනීම
  - ක්ෂය ප්‍රාග්ධනය ප්‍රතිසම්පාදනය **(ලකුණු 01)**

- ප්‍රාග්ධනය යනු භාණ්ඩ හා සේවා නිෂ්පාදන ක්‍රියාවලියට ආධාර කෙරෙන නිසා නිෂ්පාදිත නිෂ්පාදන ආධාරකයි.
  උදා : යන්ත්‍රෝපකරණ, ගොඩනැගිලි **(ලකුණු 01)**

- රටක ආයෝජනය සඳහා සම්පත් ලැබෙන්නේ ඉතුරුම් වලිනි. ඉතුරුම් ආයෝජනය කළ විට ප්‍රාග්ධනය බිහි වේ. **(ලකුණු 01)**

iv. - නිෂ්පාදනය පිළිබඳ ගැටලුව යනු භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා කවර සම්පත් භවිතා කළ යුතු ද යන්න තේරීමයි. එනම් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා කවර ශිල්පීය ක්‍රමයක් භාවිතා කළ යුතු ද යන්න තීරණය කිරීම වේ. **(ලකුණු 01)**

- නිෂ්පාදනය සඳහා භාවිතා කළ හැකි ප්‍රධාන ක්‍රම ශිල්ප දෙකකි.
  - ශ්‍රම සූක්ෂම ක්‍රමය
  - ප්‍රාග්ධන සූක්ෂම ක්‍රමය **(ලකුණු 01)**
- මෙම ගැටලුව විසදා ගැනීමේ දී වෙළෙඳපොළ ආර්ථිකයක් නිෂ්පාදකයන් සාධක වෙළෙඳපොළ මිල සංඥා සැලකිල්ලට ගනිමින් ලාභ උපරිම වන පරිදි අවම පිරිවැය සහිත ශිල්පීය ක්‍රමය තෝරා ගැනීමට කටයුතු කරති. **(ලකුණු 02)**

v. <u>තීරණ ගන්නා ඒකක වලට තොරතුරු සැපයීම</u>
මින් අදහස් වන්නේ වෙළෙඳපොළ ආර්ථිකයක පාරිභෝගික, නිෂ්පාදක හා සාධක හිමියන්ට තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු මිල මඟින් දෙන බවයි. මේ අනුව කවර භාණ්ඩයක් නිෂ්පාදනය කරනවා ද ආදී තීරණ පාරිභෝගිකයන්, නිෂ්පාදකයන්, ගනු ලබන්නේ මිල තොරතුරු පදනම් කර ගෙනයි. **(ලකුණු 02)**


<u>සළාකකරණය</u>
මින් අදහස් කරන්නේ ආර්ථිකය සතු සීමිත සම්පත් සම්භාරය විකල්ප නිෂ්පාදන අතර බෙදාහැරීමත් නිෂ්පාදිත භාණ්ඩ තොග ජනතාව අතර බෙදා හැරීමත් මිල යාන්ත්‍රණය යොදා ගන්නා බවයි. ඒ අනුව භාණ්ඩ හා සේවා ඉහළ මිලක් ගෙවිය හැකි පුද්ගලයන්ට ලබාදීමට කටයුතු කරන අතර හිඟ සම්පත් වැඩි මිලත් නියම වන භාණ්ඩ නිෂ්පාදනය සඳහාත් යෙද වේ. **(ලකුණු 02)**


02. i. ප්‍රකාශයට එකඟ නොවේ. එකිනෙකට වෙනස් සංකල්ප දෙකකි.

- ඉල්ලුම් ප්‍රසාරණය යනු ආවස්ථික භාණ්ඩයක ඉල්ලුම තීරණය කරන අනෙකුත් කරුණු නොවෙනස්ව පවතින විට සලකා බලන භාණ්ඩයේ මිල අඩුවන විට මිලදී ගන්නා ප්‍රමාණය වැඩි වීම වේ.
- ඉල්ලුම් ප්‍රසාරණයක් ඇති විමට ආදේශන ප්‍රතිවිපාකය සහ ආදායම් ප්‍රතිවිපාකය බලපානු ඇත. **(ලකුණු 01)**

ඉල්ලුම අඩුවන යනු යම් කාලපරිච්ඡේදයක් තුළ ඉල්ලුම තීරණය කෙරෙන සලකා බලන භාණ්ඩයේ මිල ස්ථාවරව පවතින විට අනෙකුත් සාධකයක (ආදේශන මිල, අනුපූරක මිල, පාරි.ආදායම, පාරිභෝගික අභිරුචිය) හෝ සාධකවල බලපෑම නිසා මිලදී ගන්නා ප්‍රමාණය අඩු වීම වේ.
ඉල්ලුම අඩුවන විට ඉල්ලුම් වක්‍රය වමට විතැන් වනු ඇත.
ඉල්ලුම අඩු වීම සඳහා

ආදේශන භාණ්ඩ මිල ගණන් පහළ යාම
අනුපූරක භාණ්ඩවල මිල ඉහළ යාම
භාණ්ඩය සාමාන්‍ය භාණ්ඩයක් නම් ආදායමපහළ යාම
පාරිභෝගික රුචිය අඩු වීම **(ලකුණු 01)**
පාරිභෝගික සංඛ්‍යාව අඩුවීම ආදී සාධක බලපානු ඇත.



ii. - <u>නිෂ්පාදන සාධක ආදේශනය කිරීමේ හැකියාව (සාධක සංචලතාවය)</u>

නිෂ්පාදන ක්‍රියාවලියේ දී යොදාගෙන ඇති නිස්පාදන සම්පත් එක් භාවිතයක සිට අනෙක් භාවිතයකට මාරු කිරීමට ඇති පහසුව සැපයුම් මිපුල නම්‍යතාවය තීරණය වීමට බලපායි

- <u>සැපයුම් තීරණ ගැනීමට අදාළ කාලය</u>

වෙළෙඳපොළ කාලය - කෙටි කාලය, දිගු කාලය වශයෙනි.
වෙළෙඳපොළ කාලය අතිශයින්ම කෙටි කාලය වන අතර ඉල්ලුම් හෝ මිලේ වෙනස්කම් කෙරෙහි ප්‍රතිවශයෙන් සැපයුම වෙනස් කිරීමට අවකාශයක් නැත. කෙටි කාලයේ දී ධාරිතාවය වෙනස් කළ නොහැකි වුවද කර්මාන්තශාලාව මෙහෙයුම් කෙරෙහි තීර්වතාවය අඩු වැඩි කළ හැකිය. එමඟින් සුළු වශයෙන් නිමවුම වෙනස් කළ හැකිය. දිගු කාලයේ දී අවශ්‍යකරණ ආකාරයට සාධක වෙනස් කරමින් ධාරිතාවය යෝග්‍ය ආකාරයට සකසා ගත හැකිය.

- <u>භාණ්ඩයේ ස්වරූපය</u>

කල්තබා ගත හැකි භාණ්ඩ සහ කල්තබා ගත නොහැකි භාණ්ඩ (නශ්‍ය භාණ්ඩ) සැපයුම් නම්‍යතාවය කෙරෙහි බලපායි. නශ්‍ය භාණ්ඩ සැපයුමේ අනම්‍යතාවක් ඇති කරන අතර කල්පවත්නා භාණ්ඩ නම්‍ය සැපයුමක් ඇති කරයි.

- <u>තොග පවතිනවාද නැද්ද යන්න</u>

නිෂ්පාදකයා සතුව ප්‍රමාණවත් හිමි භාණ්ඩ තෙිග සහ අමුද්‍රව්‍ය තොග පවතින විට වඩා නම්‍ය සැපයුම් තත්වයක් හට ගනියි.

- <u>ධාරිතාවය පිළිබඳ නම්‍යතාවයක් පැවතීම (අතිරේඛ ධාරිතාවක් තිබීම)</u>

ඛර්මාන්ත ශාලාවේ අතිරේඛ ධාරිතාවයක් පවතී නම් සැපයුම් නම්‍යතාවය එකට වඩා වැඩිය.

- <u>නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදාගන්නා යෙදවුම් වල සවරූපය</u>

**(කෙටි පැහැදිළි කිරීමක් සහිත ඕනෑම කරුණු 02 කට ලකුණු 04)**

iii. අදාළ ආර්ථික විද්‍යා සංකල්පය ආදායම් ඉල්ලුම් නම්‍යතාවය වේ. **(ලකුණු 01)**


- ඉහත සංකල්පය අනුව ආදායම් ඉල්ලුම් නම්‍යතාවය ධන 1 ක් වනු ඇත. **(ලකුණු 01)**
- අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සඳහා ආදායම වැඩිවන විට එයට වඩා අඩු ප්‍රතිශතයකින් වැඩිවනු ඇත. **(ලකුණු 01)**
- අත්‍යවශ්‍ය භාණ්ඩ සම්බන්ධයෙන් ආදායම් ඉල්ලුම් නම්‍යතාවය ධන 1 ට අඩු අගයක් ගැනිම සාමාන්‍ය ලක්ෂණය වනු ඇත. **(ලකුණු 01)**

iv. තරගකාරී වෙළෙඳපොළක ස්වේච්ඡා පදනදකින් සිදුකර ගන්නා හුවමාරු නිසා ගැනුම්කරුවන් හිමිකරගන්නා වාසිය පාරිභෝගික අතිරික්තය වනු ඇත.
පාරිභෝගිකයින් විසින් ගෙවීමට කැමති උපරිම ඉල්ලුම් මිලත් සමතුලිත මිලත් අතර වෙනස සෑම ඒකකයක් පාසාම ගණනය කළ විට ලැබෙන සමුච්චිත අගය පාරිභෝගික අතිරික්තයෙන් ඉදිරිපත් වේ.

පාරිභෝගික අතිරික්තය = $\frac{(\text{උපරිම ඉල්ලුම් මිල} - \text{සමතුලි මිල}) \times \text{සමතුලිත ප්‍රමාණය}}{2}$

$= \frac{(25 - 10)\ 200}{2}$

= <u>රු. 1500</u> **(පැහැදිළි කිරීමට ලකුණු 01 රූපසටහන මඟින් ගණනයට ලකුණු 01)**




**(ලකුණු 01)**

තරඟකාරී වෙළෙඳපොළක ස්වේච්ඡා පදනමකින් සිදු කරගන්නා හුවමාරුව නිසා නිෂ්පාදකයින් හිමිකර ගන්නා වාසිය නිෂ්පාදන අතිරික්තය වේ.


සමතුලිත මිලත් අවම සැපයුම් මිලත් අතර වෙනස සෑම ඒකකයක් පාසාම ගණනය කළ විට ලැබෙන සමුච්චිත අගය නිෂ්පාදන අතිරික්තය වේ.

$$\text{නිෂ්පාදන අතිරික්තය} = \frac{(\text{සමතුලි මිල} - \text{අවම මිල}) \times \text{සමතුලිත ප්‍රමාණය}}{2}$$

$$= \frac{(10 - 2)\ 200}{2}$$


$$= \text{රු. } 800$$

**(පැහැදිලි කිරීමට ලකුණු 01 රූපසටහන මඟින් ගණනයට ලකුණු 01)**




**(ලකුණු 01)**

v.




(නිවැරදි රූපසටහනට ලකුණු 1x2)


සමතුලිත මිල රුපියල් 100
නව සමතුලිත මිල රුලියල් 110 යි **(ලකුණු 02)**

03. i. සමාජීය, දේශපාලන හා ආර්ථික දෘෂ්ටිකෝණ වලින් බලා මෙම වෙළෙඳපොළ සමතුලිතය සමාජයට අහිතකර වේ යැයි මත පලකෙරෙන නිසා නිදහස් වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වයට රජය මැදිහත් වේ. **(ලකුණු 02)**

<u>මැදිහත් වන ප්‍රධාන ආකාර</u>

- බදු පැනවීම
- සහනාධාර ලබා දීම
- මිල පාලනය (උපරිම හා අවම මිල සීමා)
- මිල ස්ථායීකරණය **(ලකුණු 02)**

ii.




**(ලකුණු 02)**

<u>ප්‍රතිවිපාක</u>

1. අධි ඉල්ලුම නිසා ( $Q_2$ - $Q_1$ ) වෙළෙඳපොළෙහි භාණ්ඩ හිගයක් ඇති වීම.
2. නීතිවිරෝධි කළුකඩ මිල ( $P_2$) යටතේ භාණ්ඩ ( $Q_1$) අලෙවි කිරීමට තැන්කිරීම.
3. කළුකඩ මිල නිසා පෙර තිබූ සමතුලිත මිලටත් ( P) වඩා ඉහළ මිලකට ( $P_2$) භාණ්ඩ අලෙවි කිරීම.
4. නිෂ්පාදන ක්ෂේත්‍රයේ කරනු ලබන ආයෝජන සීමා වීම. **(ලකුණු 02)**
5. සමාජ ශුභසාධනය හානි වීම.

iii. අ) Qd = 100 - 10p

Qd = 100 - 10 x 6

= 100 - 60

= 40

පාරිභෝගිකයන් මිලදී ගනු ලබන ඒකක ප්‍රමාණය 40 යි. **(ලකුණු 02)**

ආ) Es = Qs - Qd

= 100 - 40

= 60

අතිරික්ත සැපයුම ඒකක 60 යි. **(ලකුණු 01)**

රජයේ පිරිවැය = රු. 6.00 x 60
= රු. 360.00 **(ලකුණු 01)**

ඉ) 1. අතිරික්තය ගබඩා කිරීම
2. අතුරු නිෂ්පාදනය
3. පවත්නා ඉල්ලුම ප්‍රවර්ධනය
4. අපනයන **(ලකුණු 02)**

ඊ) නිෂ්පාදන අතිරික්තය $= \frac{(රු.\ 6.00 - රු.\ 1.00) \times 100}{2}$

$= \frac{5 \times 500}{2}$

$= \frac{2500}{2}$

= රු. 1250.00 ඉ

iv. අ) කෘෂිකාර්මික භාණ්ඩවල **(ලකුණු 01)**
ආ) කෘෂිකාර්මික භාණ්ඩ සඳහා පවතින ඉල්ලුම, මිල අනම්‍ය වීම/ අනවශ්‍ය ඉල්ලුමක් පැවතීම **(ලකුණු 01)**

ඉ) - නිෂ්පාදකයන් මත සලකා නියම කිරීම.
- තොග රැස් කිරීම හා මුදා හැරීම.
- ඉඩම් වගා කරන ප්‍රමාණය සීමා කිරීම.
- ආනයන තීරුබදු පැනවීම.
- ආනයන සලාක කිරීම.
- අභිමතය පරිදි ආනයන සීමා කිරීම. **(කරුණු 2 ට ලකුණු 02)**

04. අ) i. ව්‍යාපාර ආයතනයක ගණකාධිකාරී ලාභ ගන්නේ ආයතනයේ මුළු අයභාරයෙන් ක්ෂයවීම් ඇතුලු ඍජු පිරිවැය අඩු කිරීමෙනි.

එහෙත් ආර්ථික ලාභ ලබා ගැනීමේ දී මුලු අයභාරයෙන් ඍජු පිරිවැයට අමතරව වක්‍ර පිරිවැය ද අඩු කළ යුතු නිසා ආර්ථික ලාභ වලට වඩා ගණකාධිකාරී ලාභ වැඩිවෙයි. **(ලකුණු 02)**

ii. හීනවන ආන්තික මිල මඟින් ආයතනයක ස්ථාවර යෙදවුම් වලට විචල්‍ය යෙදවුම් වැඩි කරන විට යම් අවස්ථාවකින් පසු අතිරේක විචල්‍ය යෙදවුමක ඵලදාව හීනවීම අදහස් කරයි. මෙම හීනවන ඵල මඟින් කෙටිකාලීන ආන්තික පිරිවැය ඉහළ නංවයි. හේතුව නම් අතිරේක විචල්‍ය යෙදවුමක ඵලදාව හෙවත් ආන්තික ඵලදාව අඩුවන නිසයි. හීනවන ආන්තික ඵල සහ ආන්තික පිරිවැය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවක් ගොඩ නැගෙයි.

හීනවන පරිමාණුකූල ඵල යටතේ දිගුකාලයේ දී යෙදවුම් වැඩි කරන වේගයට වඩා අඩු වේගයෙන් නිමවුම ඉහළ යන නිසා මූල්‍යමය වශයෙන් දිගුකාලීන අරපිරිමැසුම්/ නොපිරිමැසුම් හේතු කොට ගෙන දිගු කාලීන සාමාන්‍ය පිරිවැය ඉහළ යයි. **(ලකුණු 03)**

ආ) i. පූර්ණ තරග ව්‍යාපාර ආයතනයක් මුහුණදෙන ඉල්ලුම් වක්‍රය තිරස් අක්ෂයට සමාන්තර පූර්ණ නම්‍ය (අපරිමිත නම්‍යතාවක්) ඉල්ලුම් වක්‍රයකට මුහුණ දෙයි. **(ලකුණු 01)**

මෙයට හේතුව නම් ආයතන විශාල සංඛ්‍යාවක් තිබීමත් සමජාතීය භාණ්ඩ විකිණීමත් පාරිභෝගිකයින්ට වෙළෙඳපොළ පිළිබඳ පූර්ණ දැනුමක් පැවතීමත් නිසා පැවරුනු මිලකට භාණ්ඩ අලෙවි කිරීමට සිදුවන නිසයි.

**(ලකුණු 03)**

ii. ප්‍රාමානික ලාභ ලබනුය් ආයතනයේ මුලු අයභාරය, මුලු පිරිවැයට සමාන (TR=TC) හෝ සාමාන්‍ය අයභාරය සාමාන්‍ය පිරිවැයට (AR=AC) සමාන වන විටදීය. **(ලකුණු 01)**


මෙම ආර්ථික ලාභ ශූන්‍ය වන තත්වයක් නොව සතුටු විය යුතු තත්වයකි. හේතුව නම් එම අවස්ථාවේ ආයතනවල නිෂ්පාදනයට අදාළ සියලුම සම්පත් වල ආවස්ථික පිරිවැය ආවරණය වන නිසයි. ආර්ථික ලාභ හෝ අලාභ නෙලබන නිසා කර්මාන්තයට අලුත් ආයතන ඇතුලු වීමක් හෝ පිටවීමක් සිදු නොවේ. ඒ අනුව මෙම ප්‍රාමාණික ලාභ ලබන තත්වය සතුටු විය යුතු තත්වයකි. **(ලකුණු 03)**

iii. ආයතනයේ මුලු අයභාරය රුපියල් මිලියන 1000 ක් වන අතර මුලු පිරිවැය රුපියල් මිලියන 1200 ක් නම් ආයතනය රුපියල් මිලියන 200 ක අලාභයක් ලබයි. **(ලකුණු 01)**

ආයතනයේ මුලු ස්ථාවර පිරිවැය (TFC) රුපියල් මිලියන 4000 ක් වන අතර මුලු විචල්‍ය පිරිවැය රු. මිලියන 8000 කි. මෙම අවස්ථාවේ නිෂ්පාදනය නතර කොට ආයතනය වසා දැමුවහොත් මුලු ස්ථාවර පිරිවැය වන රුපියල් මිලියන 4000 ක්ම අලාභ වේ. හේතුව නම් එම පිරිවැය දැනට යට කරන ලද නොවැලැක්විය හැකි පිරිවැයක් වන නිසයි.

එහෙත් නිෂ්පාදනයේ තව දුරටත් නිරත වේ නම් මුලු අයභාරය වන රුපියල් මිලියන 1000 න් මුලු විචල්‍ය පිරිවැය වන රුපියල් මිලියන 8000 ක් පියවා ගනියි. මුලු ස්ථාවර පිරිවැයෙන් ද රුපියල් මිලියන 2000 ක් ද පියවා ගතහැකි නිසා රුපියල් මිලියන 4000 ක අලභය රුපියල් මිලියන 2000 කට අවම කර ගත හැකිය. එම නිසා ආයතනය තව දුරටත් නිෂ්පාදනයේ රැඳී සිටීම වඩා තාත්වික වෙයි. **(ලකුණු 03)**

iv. සාපේක්ෂ වශයෙන් අනම්‍ය සැපයුමක් තිබෙන සාධකයක සංක්‍රාම ඉපයුම් වලට වඩා ආර්ථික බදු කුලිය වැඩි වෙයි. **(ලකුණු 01)**




**(රූප සටහනට ලකුණු 02)**

05. i. ජාතික ආදායම් ගිණුම් වල ප්‍රයෝජනවත් බව

- ආර්ථිකයේ කාර්ය සාධනය ඇගයීම
- ආර්ථික වෘද්ධිය මැනීම
- ප්‍රතිශීර්ෂ ආදායම් ජාත්‍යන්තර වශයෙන් සැසඳීම
- ආර්ථිකයේ ව්‍යුහමය ලක්ෂණ හඳුනා ගැනීම
- රටේ ජනතාවගේ ජීවන තත්වය සහ ශුභසාධනය තක්සේරු කිරීම
- ආදායම් වල කාර්යාත්මක සම්බන්ධතා හඳුනා ගැනීම
- සාර්ව ආර්ථිකයේ ග්‍රිතාත්මක සම්බන්ධතා හඳුනා ගැනීම
- ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති සම්පාදනය සහ සැලසුම් කිරීම
- ආර්ථිකයේ මූලූ සම්පත් සහ ඒවා උපයෝජනය කරන ආකාරය හඳුනා ගැනිම
- සාර්ව ආර්ථික විචල්‍යන්ගේ හැසිරීම් පුරෝකථනය

**(ඕනෑම කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04)**

ii. අ) (රුපියල් මිලියන)

| | | | |
|---|---|---|---|
| සේවක ආදායම් | = | 4 500 | |
| ශුද්ධ මෙහෙයුම් අතිරික්තය | = | 7 000 | |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය | = | 500 | |
| මිශ්‍ර ආදායම් | = | 1 000 | |
| නිෂ්පාදනය මත වෙනත් බදු - එම සහනාධාර | = | 1 200 | |
| මූලික මිල අනුව සමස්ථ එකතු කල අගය | = | 14 200 | **(ලකුණු 01)** |
| භාණ්ඩ හා සේවා මත අයකරන බදු - සහනාධාර (1800 - 400) | = | 1 400 | **(ලකුණු 01)** |
| වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය | = | 15 600 | **(ලකුණු 01)** |

ආ)

| | | | |
|---|---|---|---|
| දළ දේශීය නිෂ්පාදිතය | = | 15 600 | |
| + විදේශීය ප්‍රාථමික ආදායම් ලැබීම් | = | 950 | |
| - විදේශීය ප්‍රාථමික ආදායම් ගෙවීම් | = | 1 450 | |
| දළ ජාතික ආදායම | = | 15 100 | **(ලකුණු 02)** |

ඉ)

| | | | |
|---|---|---|---|
| දළ ජාතික ආදායම | = | 15 100 | |
| + විදේශීය ජංගම සංක්‍රාම ලැබීම් | = | 2 400 | |
| - විදේශීය ජංගම සංක්‍රාම ගෙවීම් | = | 600 | |
| වැය කළ හැකි දළ ජාතික ආදායම | = | 16 900 | **(ලකුණු 02)** |

ඊ)

| | | | |
|---|---|---|---|
| වැය කළ හැකි දළ ජාතික ආදායම | = | 16 900 | |
| - මුළු පරිභෝජන වියදම | = | 12 600 | |
| දළ ජාතික ඉතිරිකිරීම් | = | 4 300 | **(ලකුණු 02)** |

උ)

| | | | |
|---|---|---|---|
| දළ දේශීය නිෂ්පාදිතය | = | 15 600 | |
| + ශුද්ධ අපනයන | = | -1 000 | |
| දළ දේශීය වියදම | = | 14 600 | |
| - මුළු පරිභෝජන වියදම | = | 12 600 | |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | = | 20 000 | **(ලකුණු 02)** |

(විකල්ප ක්‍රම පිළිබඳ සැලකිලිමත්වන්න)

iii. අ) $K_Y = \frac{1}{1 - b}$ $\quad$ $K_T = \frac{1}{1 - b}$

$= \frac{1}{1 - 0.8}$ $\quad$ $= \frac{0.8}{1 - 0.8}$

$= \frac{1}{0.2}$ $\quad$ $= \frac{8}{2}$

රාජ්‍ය වියදම් ගණන = 5 **(ලකුණු 01)**

රාජ්‍ය බදු ගණන = 4 **(ලකුණු 01)**

ආ) y = E

y = C + I + G

y = 100 + 0.8yd + 400 + 300

y = 800 + 0.8 ( y - 400 )

y = 800 + 0.8 y - 320

y = 480 + 0.8 y

y - 0.8 y = 480

$y = \frac{480}{2}$

= 2400

නිමවුම් පරතරය = පූර්ණ සේවා නියුක්තියේ දී නිමවුම් මට්ටම - පවත්නා නිමවුම් මට්ටම

= 4000 - 2400

= 1600 **(ලකුණු 01)**

පූර්ණ සේවා නියුක්තිය අත්කර ගැනීමට රාජ්‍ය මිලදී ගැනීම් ඉහළ දැමිය යුතු ප්‍රමාණය

$= \frac{\text{නිමවුම් පරතරය}}{\text{ආණ්ඩුවේ වියදම් ගුණකය}}$

$= \frac{1600}{5}$

= 320 **(ලකුණු 01)**

පූර්ණ සේවා නියුක්තිය අත්කර ගැනීම සඳහා බදු පහළ දැමිය යුතු ප්‍රමාණය

$= \frac{\text{නිමවුම් පරතරය}}{\text{බදු ගුණකය}}$

$= \frac{1600}{4}$

= 400 **(ලකුණු 01)**

## 'ආ' කොටස

06. i.

| ව්‍යවහාර මුදල් | ආසන්න මුදල් |
|---|---|
| 1. රටක මූල්‍ය අධිකාරිය විසින් නිකුත් කරන නීත්මය වලංගුභාවයක් ඇති පොදු පිළිගැනීමක් සහිත මුදල් වේ. උදා : කාසි හා නෝට්ටු | 1. මුදලේ කාර්යයන් අතරින් වටිනාකමේ සන්නිදියක් ලෙස පමණක් කටයුතු කරන මදල් වර්ග වේ. උදා : භාණ්ඩාගාර බිල්පත්, ඉතුරුම් තැන්පත්, කාලීන තැන්පත් |
| 2. පූර්ණ ද්‍රවශීල වත්කමකි. | 2. ඉහළ ද්‍රවශීලතාවයක් ඇති වත්කම් ය. |
| 3. ඍජුවම ගණුදෙනු සඳහා යෙදවිය හැකිය. | 3. ගණුදෙනු සඳහා යොදවා ගැනීමට මුදල් බවට පත්කළ යුතුය. |
| 4. ව්‍යවහාර මුදල් පවත්වා ගැනීමෙන් ආදායමක් ලබා ගත නොහැකි වීම. | 4. ආසන්න මුදල් පවත්වා ගැනීමෙන් ආදායමක් උපයා ගත හැකිය. **(ලකුණු 04)** |

ii. අ) - රටක ද්‍රවශීලතාව නිවැරදිව ගණනය කළ හැකි වේ.
- රටක මූල්‍ය ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාත්මක කළ හැකි වේ.
- මුදල් සැපයුම හා උද්ධමනය අතර සම්බන්ධතාව විග්‍රහ කළ හැකිය.

**(ඕනෑම කරුණු 02 කට ලකුණු 02)**

ආ) - මහජනයා සතු වණිජ බැංකුවල ඇති කාලීන හා ඉතුරුම් තැන්පත් (TSDP)
- අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ඇති මහජනයා සතු කාලීන හා ඉතුරුම් තැන්පත් ප්‍රමාණයෙන් 50% ($TSD_{NRFC}$)
- විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක වල ඇති නේවාසිකයන් සතු තැන්පත් ප්‍රමාණය ($RD_{FCBU}$) **(සංරචක 03 ම නිවැරදි නම් ලකුණු 02)**

iii. අ) මහ බැංකුව රජයෙන් ඩොලර් බිලියන 400 ක් මිලට ගත්විට මහ බැංකුවේ විදේශ වත්කම් බහළ යන අතර ශුද්ධ විදේශ වත්කම් ප්‍රමාණය මත මුදල් නිකුතුව සිදුවන බැවින් පදනම් මුදල් ඉහළ ගොස් මුදල් සැපයුම ද වැඩි වේ. **(ලකුණු 02)**

ආ) මහ බැංකුව රාජ්‍ය බැංකු වල රු. මිලියන 10 භාණ්ඩාගාර බිල්පත් අලෙවිකළ විට වාණිජ බැංකු සතු අධි සංචිත පහත වැටෙන අතර වාණිජ බැංකු සතු මුදල් මහ බැංකුව වෙත ගලායාමෙන් පදනම් මුදල් අඩුවේ. එසේම අධි සංචිත පහත වැටීම නිසා ණය සැපයුම අඩු වීමෙන් මුදල් සැපයුම ද පහත වැටෙයි. **(ලකුණු 02)**

ඉ) මහ බැංකුව විදේශ විනිමය වෙළෙඳපොළෙහි ඩොලර් 500 ක් අලෙවි කළ විට එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යවහාර මුදල් නිකුත් කෙරෙන බැවින් පදනම් මුදල් ඉහළගොස් සැපයුම වැඩිවේ. **(ලකුණු 02)**

iv. අ) රාජ්‍ය සේවකයන් ස්ථාවර ආදායම් ලබන්නන් වේ. එබැවින් උද්ධමනයට ගැලපෙන පරිදි වැටුප් වැයවීමක් සිදු නොවන නිසා උද්ධමනය ඔවුන්ට අවාසිදායක වේ.

ආ) ණය ගැතියන් ලබා ගන්නා ණය ආයෝජනය හෝ වෙනත් වත්කම් අත්පත් කර ගැනීමට යොමු කෙරෙන අතර රම වත්කම් වල වටිනාකම උද්ධමනයක් සමග වැඩිවන බැවින් උද්ධමනය ණයගැතියන්ට වාසිදායක වේ.

ඉ) උද්ධමනයේ දී භාණ්ඩහා සේවා මිල ගණන් ඉහළ යන බැවින් අපනයනවල තරගකාරිත්වය අඩු වී අපනයන ඉපයුම් අඩුවේ. දේශීය මිල ගණන්වලට වඩාආනයන මිල ගණන් අඩුවන බැවින් ආනයන ඉල්ලුම ඉහළගොස් ආනයන වියදම වැඩි වී විනිමය අනුපාතය අවාසිදායක වේ.

ඊ) ඉතුරුකරන්නන්ට උද්ධමනයේ බලපෑම මූර්ත පොළී අනුපාතය මත තීරණය වේ. මූර්ත පොළී අනුපාතය ධන අගයක් ගන්නේ ඉතුරුම් ධෛර්යමත් වන අතර එය ඍණ අගයක් ගනී නම් ඉතුරුම් අධෛර්යමත් වේ.

**(ලකුණු 1 x 4)**

v. - නිෂ්පාදක මිල දර්ශනයේ උපනෙති ඇසුරින් දේශීය වෙළෙඳපොළ තොග හා සිල්ලර මිල ගණන් පුරෝකථනය කළ හැකි බව.
- මූල්‍ය ප්‍රතිපත්තිය වඩා සාර්ථකව ක්‍රියාත්මක කිරීමට ප්‍රයෝජනවත් වීම.
- දර්ශකයේ වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් ආයෝජකයන්ට ආදායම් වියදම් ඇස්තමේන්තු සැකවිය හැකි වීම. **(කරුණු 02 ක් සඳහා ලකුණු 02)**

07. i.

| ලංකා බැංකුව | ශ්‍රී ලංකා මහ බැංකුව |
|---|---|
| 1. බලපත්‍රලාභී වාණිජ බැංකුවකි.<br>2. මෙවැනි බැංකු රාශියක් (26 ක්) ඇත.<br>3. මහ බැංකුව යටතේ ආයතනයකි.<br>4. ද්‍රවශීලතාව ආරක්ෂාකර ගැනීම හා ලාභදායීත්වය ඉහළ නංවා ගැනීම අරමුණ වේ.<br>5. මහජනතාවගේ තැන්පතු භාර ගනියි.<br>6. බැංකු මුදල් සැපයුමට දායකවේ. (DDP) | 1. කේන්ද්‍රීය හෙවත් මධ්‍යම බැංකුවකි.<br>2. එක් බැංකුවක් පමණි.<br>3. ස්වාධීන ආයතනයකි.<br>4. ආර්ථික මිල ස්ථායීතාව පවත්වා ගෙන යාම සහ මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව පවත්වා ගෙන යාම අරමුණ වේ.<br>5. මහජනතාවගේ තැන්පතු භාර ගනියි.<br>6. ව්‍යවහාර මුදල් සැපයුමට දායකවේ.(CP)<br><br>**(වෙනස්කම් 04 කට ලකුණු 04)** |

ii. තැන්පතු ප්‍රසාරණ සංගුණකය යනු ආරම්භක ඉල්ලුම් තැන්පතුවක් මෙන් කොපමණ ගුණයකින් ඉල්ලුම් තැන්පතු වැඩිවේද යන්නයි. (ලකුණු 02)

තැන්පතු ප්‍රසාරණ ගුණකය ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයේ පරස්පරයට සමාන වේ.

$$\text{බැංකු තැන්පතු ප්‍රසාරණ සංගුණකය (K)} = \frac{1}{\text{ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය}}$$

$$K = \frac{1}{r}$$ **(ලකුණු 01)**

නිදසුන : ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 20% ක් නම් ,

$$K = \frac{1}{R}$$
$$= \frac{1}{20\%}$$
$$= 5$$ **(ලකුණු 01)**

iii. අ) අධි සංචිත තිබේ.

අධි සංචිතය = පවත්නා සංචිතය - අවශ්‍ය සංචිතය
= 30 000 - 20 000
= රු. 10 000 **(ලකුණු 02)**

ආ)

| වගකීම් | | ශේෂ පත්‍රය | වත්කම් |
|---|---|---|---|
| තැන්පතු | 200 000 | සංචිත | 20 000 |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 5 000 | සුරකුම්පත් | 60 000 |
| | | ණය | 170 000 |
| | 250 000 | | 250 000 |

(ලකුණු 02)

iv. මුදල්වෙළෙඳපොලේ ද්‍රවශීලතාව හා පොළී අනුපාතය කෙරෙහි බලපෑම් ඇතිකිරීම සඳහා මහ බැංකුව විසින් රජයේ සුරකුම්පත් හෝ රජය විසින් සහතික කරනු ලැබූ සුරකුම්පත් හෝ මිලදී ගැනීම හා විකිණීම විවට වෙළෙඳපොළ කටයුතුවේ. නැතහොත්, විවෘත වෙළෙඳපොළේ මහ බැංකු සුරකුම්පත් විකීණීම සහ මිලට ගැනීමයි. **(ලකුණු 02)**

<u>පරමාර්ථ</u>

- පොළී අනුපාතිකයන් පිළිබඳ යම් උපරිම සීමා නියම කිරීම.
- වාණිජ බැංකුවල ව්‍යවහාර මුදල් සංචිතය වෙනස් කොට මුදල් සැපයුම කෙරෙහි බලපෑමක් ඇති කිරීම. **(ලකුණු 01)**

<u>හැකියාව සීමා කෙරෙන සාධක</u>


- වාණිජ බැංකු අධිසංචිත පවත්වා ගැනීම/ අවම සංචිත අනුපාතය ස්ථාවර පවත්වා ගෙන යාමට අනුගත ද යන්න.
- සුරකුම්පත් මිලදී ගැනීමට ප්‍රමාණවත් ගැනුම්කරුවන් නොසිටීම/ විකිණීමට අවශ්‍ය තරම් සුරකුමපත් නොතිබීම. **(ලකුණු 01)**

v.
- බැංකු පද්ධතිය වෙතින් බැංකු නොවන මූල්‍ය ආයතන කරා ව්‍යවහාර මුදල් ගලායාම.
- ව්‍යවහාර මුදල් ළඟ තබා ගැනිම සඳහා මහජනතාව දක්වන අභිරුචිය.
- අධි සංචිත තබා ගැනීමට වාණිජ බැංකු දක්වන කැමැත්ත.
- බැංකු ණය සඳහා ප්‍රමාණවත් ඉල්ලුමක් ඇති නොවීම. **(ලකුණු 04)**

08. i.
- ඉහළ ආදායම් ලබන්නන්ගෙන් අනුක්‍රමික ස්වරූපයෙන් බදු අය කිරීම.
  උදා : පෞද්ගලික ආදායම් බදු
- අඩු ආදායම්ලාභීන් සඳහා සහනාධාර සැපයීම.
  උදා : සමෘද්ධි දීමනා, පෙහොර සහනාධාර
- ශුභ සාධන භාණ්ඩ සැපයීම.
  උදා : අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා
- මිල පාලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- භාණ්ඩ මත බදු පැනවීම අවම කිරීම සහ අත්‍යවශ්‍ය භාණ්ඩ බදු වලින් නිදහස් කිරීම.
- දිළිඳු ජනතාවට දේපළ පවරා දීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- සුඛෝපභෝගී භාණ්ඩ මත බදු පැනවීම.

**(ඕනෑම කරුණු 04 ක් සඳහා ලකුණු 04)**

ii. පාසල් ළමුන්ට නොමිලේ නිල ඇඳුම් වවුචර ලබා දීම ධන බාහිරතා ඇති කිරීමට හේතු වේ. **(ලකුණු 01)**




(ලකුණු 02)

(ලකුණු 02)

ඉහත දැක්වෙන ප්‍රස්තාර සටහන අනුව වෙළෙඳපොළ මඟින් සපයන පරිභෝජන මට්ටම Qp වන නමුත් සමාජීය ප්‍රශස්ත පරිභෝජන මට්ටම Qs වේ. ඒ අනුව වෙළෙඳපොලේ පවතින්නේ සමාජීය ප්‍රශස්ත පරිභෝජන මට්ටමට වඩා අඩු පරිභෝජනයකි. **(ලකුණු 01)**

iii. අ) <u>වර්තන ගිණුමේ ශේෂය</u>

වර්තන ගිණුමේ ශේෂය ලබාගන්නේ මුළු රාජ්‍ය ආදායමෙ වර්තන වියදම් අඩු කිරීමෙනි.

වර්තන ගිණුමේ ශේෂය = මුළු රාජ්‍ය ආදායම - පුනරාවර්තන වියදම
(බදු සහ බදු නොවන ආදායම) **(ලකුණු 01)**

මේ මඟින් නිරූපනය වන්නේ රාජ්‍ය ඉතුරුම් පවතීද නැද්ද යන්නයි. වර්තන ගිණුමේ අතිරික්තයක් පවතී නම් ප්‍රාග්ධන වියදම් සඳහා යෙදවීමට රජය උපයන ආදායම යෙදවිය හැකි බව දැකක්වෙන අතර එය දේශීය ඉතුරුම් වැඩි වීමට ද හේතුවක් වේ. **(ලකුණු 01)**

ආ) <u>ප්‍රාථමික ශේෂය</u>

අයවැයෙහි ප්‍රාථමික හිඟය ලබා ගන්නේ දීමනා සහිත මුළු රාජ්‍ය ආදායමින් රාජ්‍ය ණය පොළී වියදම ඇතුළත් නොවූ වර්තන වියදම හා ප්‍රාග්ධන වියදම අඩු කිරීමෙනි.

ප්‍රාථමික ශේෂය = දීමනා ඇතුළත් මුළු රාජ්‍ය ආදායම − (ණය පොළී ඇතුළත් නොවූ වර්තන වියදම + ප්‍රාග්ධන වියදම්)

විකල්ප පිළිතුරු :
ප්‍රාථමික ශේෂය = සමස්ථ ශේෂය - රාජ්‍ය ණය සඳහා පොළී ගෙවීම් **(ලකුණු 01)**

ප්‍රාථමික ශේෂය රජය ණය ප්‍රමාණය තීරණය කරන ප්‍රධාන සාධකයකි. ප්‍රාථමික ශේෂය අතිරික්තයක් බිහි වන්නේ නම් එය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණය අඩු කිරීමෙන් වාසිදායක ලෙස බලපායි. **(ලකුණු 01)**

ඉ) <u>සමස්ථ ශේෂය</u>

අයවැයෙහි සමස්ථ ශේෂය ලබා ගන්නේ දීමනා සහිත මුළු රාජ්‍ය ආදායමින් මුළු රාජ්‍ය වියදම අඩු කිරීමෙනි.

සමස්ථ ශේෂය = දීමනා ඇතුළත් මුළු රාජ්‍ය ආදායම - මුළු රාජ්‍ය වියදම
(වර්තන වියදම් + ප්‍රාග්ධන වියදම්)
**(ලකුණු 01)**

සමස්ථ ශේෂ හිඟයක් ඇති වීම රාජ්‍ය ණය ඇතුළු රාජ්‍ය මූලය දර්ශකයන්හි අයහපත් ප්‍රවනතා ඇති කිරීමටබ සෘජුව ම බලපායි. මෙය ගණනය කිරීමෙන් ආර්ථික අස්ථිතාවන් පාලනය කර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට ක්‍රියා මාර්ග ගත නොහැකි වේ. **(ලකුණු 01)**

iv. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය ද.දේ.නි ප්‍රතිශතය 2017 වර්ෂයට සාපේක්ෂව අඩු වී ඇතත් තව දුරටත් ඉහළ මට්ටමක පවතී.

- 2018 රාජ්‍ය ණය ද.දේ.නි ප්‍රතිශතයක් ලෙස 82.9%
- 2018 රාජ්‍ය ණය සේවා අනුපාතය ද.දේ.නි ප්‍රතිශතයක් ලෙස 14.5%
- 2018 රාජ්‍ය ණය සේවා අනුපාතය රාජ්‍ය ආදායමේ ප්‍රතිශතයක් ලෙස 108.8%

**(ඕනෑම දත්ත 02 ක් සඳහා ලකුණු 02)**

v. අ) පසුගිය වසර දෙක තුළ ශ්‍රී ලංකාවේ අයවැය හිඟය පියවා ගැනීමට යොදාගත් ප්‍රධාන මූලාශ්‍ර

<u>දේශීය මූලාශ්‍ර</u>

- වෙළෙඳපොළ ණය
  බැංකු නොවන මූලාශ්‍ර : සේවා අර්ථසාධක අරමුදල
  ජාතික ඉතිරිකිරීමේ බැංකුව
- බැංකු මූලාශ්‍ර : මහ බැංකුව
  වාණිජ බැංකු

<u>විදේශ මූලාශ්‍ර</u> : ව්‍යාපෘති ණය
සහනදායී ණය
සහනදායී නොවන ණය

**(ඕනෑම මූලාශ්‍ර 02 කට ලකුණු 02)**

ආ) <u>ආර්ථික ප්‍රතිවිපාක</u>

- ණය ලබා ගැනීමට දේශීය මූලාශ්‍ර භාවිතා කිරීමේ දී 'තෙරපුම් ප්‍රතිවිපාක' බිහිවීම
- හැංකු මඟින් ණය ලබා ගැනීමේ දී මහ බැංකුවෙන් ණය ලබා ගන්නා විට පදනම් මුදල් ඉහළ නිසා මුදල් සැපයුම වැඩි වීම උද්ධමනීය බලපෑම් ඇති වීම.
- වාණිජ බැංකු මඟින් ණය ලබා ගැනීමේ දී මුදල් මැවීම හේතුවෙන් මුදල් සැපයුම වැඩි වී උද්ධමනීය බලපෑම් ඇති වීම.
- විදේශ මූලාශ්‍ර මඟින් මූල්‍යමය ණය ලබා ගැනීම නිසා මුදල් සැපයුම වැඩි වීම.
- විදේශ සහනදායී නොවන ණය ලබා ගැනිම දැඩි කොන්දේසි, පිරිවැය අධික වීම හේතු වීම.

**(ඕනෑම කරුණු 02 කට ලකුණු 02)**

09. අ) i. භාණ්ඩ දෙකම නිපදවීමේ නිරපේක්ෂ වාසිය තිබෙන රට B රටයි. **(ලකුණු 02)**

ii. <u>A රට</u>

$$\text{තිරිඟු ඒකකයක ආවස්ථික පිරිවැය} = \frac{\Delta \text{ රෙදි}}{\Delta \text{ තිරිඟු}} = \frac{6}{18} = \frac{1}{3} = 0.3$$

<u>B රට</u>

$$\text{තිරිඟු ඒකකයක ආවස්ථික පිරිවැය} = \frac{\Delta \text{ රෙදි}}{\Delta \text{ තිරිඟු}} = \frac{20}{20} = 1$$

A රට

රෙදි ඒකකයක ආවස්ථික පිරිවැය = $\frac{\Delta \text{ තිරිඟු}}{\Delta \text{ රෙදි}} = \frac{18}{6} = 3$

B රට

රෙදි ඒකකයක ආවස්ථික පිරිවැය = $\frac{\Delta \text{ තිරිඟු}}{\Delta \text{ රෙදි}} = \frac{20}{20} = 1$

A රටට තිරිඟු නිෂ්පාදනය සම්බන්ධයෙන් අඩු ආවස්ථික පිරිවැය නිසා A රටට තිරිඟු නිපදවීමේ සාපේක්ෂ වාසිය ඇත.

B රටට රෙදි නිෂ්පාදනය සම්බන්ධයෙන් අඩු ආවස්ථික පිරිවැය නිසා B රටට රෙදි නිපදවීමේ සාපේක්ෂ වාසිය ඇත. **(ලකුණු 02)**

iii.

a. A රටට රෙදි ඒකකයක් ලබා ගැනීමට හුවමාරු කළ යුතු තිරිඟු ඒකක 02 කි.

b. වෙළෙඳාමක් නොමැති නම් රෙදි ඒකකයක් ලබා ගැනීමට කැප කළ යුතු රෙදි ඒකක 03 කි.

c. වෙළෙඳාමක් නොමැති නම් B රටට තිරිඟු ඒකකයක් ලබා ගැනීමට කැප කළ යුතු රෙදි ඒකක 01 කි.

d. විශේෂීකරණය යටතේ B රටට තිරිඟු ඒකකයක් ලබා ගැනීමට හුවමාරු විය යුත්තේ රෙදි ඒකක 1/2 කි. **(1/2 x 1 = 1/2)** **(කොටසකට ලකුණු 02 බැගින් ලකුණු 08)**

ආ) i. සඵල ආරක්ෂණ අනුපාතය ඉහළ යන අවස්ථා නම්,

- ආනයන නිමි භාණ්ඩයට තීරු බදු පැනවීම හෝ වැඩි කිරීම
- ආනයන යෙදවුම් වලට තරු බදු ඉවත් කිරීම හෝ අඩු කිරීම
- දේශීය නිපදවන භාණ්ඩයෙහි ආනයන යෙදවුම් ප්‍රතිශතය අඩු වීම

**(කරුණු 02 කට ලකුණු 02)**

ii. තරඟකාරිත්ව වාසිය යනු කිසියම් භාණ්ඩයක් පාරිභෝගිකයින් වෙත සැපයීමේ දී සෙසු තරඟකරුවන්ට වඩා වැඩි ගුණාත්මක සේවයක් ලබා දීම තුළින් පාරිභෝගිකයින්ට වැඩි වටිනාකමක් ලබා දීමයි. **(ලකුණු 02)**

පිරිවැයේ මූලාශ්‍ර

- ඵලදායිතාවය ඉහළ මට්ටමක පැවතීම
- යෙදවුම් අවම පිරිවැයක් සහිතව ලබා ගැනීමට කේවල් කිරීමේ ශක්තිය යොදා ගැනීම
- ධාරිතා උපයෝජනය ඉහළ මට්ටමක පැවතීම
- නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා තාක්ෂණය සඵල අයුරින් යොදා ගැනීම
- වඩා කාර්යක්ෂම බෙදා හැරීම් ජාලයන්ට ප්‍රවේශය ලබා ගැනීම

ප්‍රභේදනය සඳහා මූලාශ්‍ර

- ගුණාත්මක වශයෙන් ඉතා ඉහළ මට්ටමේ නිෂ්පාදිත බිහි කිරීම
- සන්නාම් සඳහා යොමු කිරීම
- නවෝත්පාදන බිහි කිරීම
- බුද්ධිමය දේපල හිමි කර ගැනිම
- ප්‍රචාරණය

**(ඕනෑම එක් උදාහරණයකට ලකුණු 01)**

iii. නිදහස් වෙළෙඳාම තීරණය කෙරෙන තීරුබදු නොවන බාධක නම්,
- සලාක නියම කිරීම
- ආනයන අපනයන බලපත්‍ර ක්‍රියාත්මක කිරීම
- ප්‍රපතනයට මුහුණ දීම
- විනිමය පාලනය
- අනයන තහනම් කිරීම
- පාරිසරික හා සෞඛ්‍යාක්ෂිත ප්‍රමිතීන් නියම කිරීම
- වෙළෙඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම
- කලාපීය ආර්ථික සහයෝගීතා ගිවිසුම් ඇති කර ගැනීම
- ස්වේච්ඡාවෙන් ආනයන සීමා කිරීම
- කාටල් පිහිටුවීම
- අපනයන සහනාධාර ලබා දීම

**(එක් කරුණකට එක බැගින් ලකුණු 03)**

10. i.

අ) ජංගම ගිණුමේ භාණ්ඩ ගිණුම හර
මූල්‍ය ගිණුම මුදල් තැන්පතු ගිණුම බැර

ආ) ජංගම ගිණුම ප්‍රාථමික ආදායම් හර
මූල්‍ය ගිණුම මුදල් තැන්පතු ගිණුම බැර

ඉ) ජංගම ගිණුම ද්විතීක ආදායම් හර
මූල්‍ය ගිණුම මුදල් තැන්පතු ගිණුම බැර

ඊ) මූල්‍ය ගිණුම මුදල් තැන්පතු ගිණුම හර
මූල්‍ය ගිණුම අනෙකුත් ආයෝජන ගිණුම බැර

**(ගිණුම් දෙකම සටහන් කළ යුතුය) (ලකුණු 1x4)**

ii.

අ)

| | | | |
|---|---|---|---|
| භාණ්ඩ අපනයන | = | 200 | |
| භාණ්ඩ ආනයන | = | 350 | |
| වෙළෙඳ ශේෂය | = | - 150 | **(ලකුණු 01)** |

ආ)

| | | | |
|---|---|---|---|
| භාණ්ඩ අපනයන | = | 270 | |
| භාණ්ඩ ආනයන | = | 370 | |
| ශුද්ධ අපනයන | = | - 170 | **(ලකුණු 01)** |

ඉ)

| | | | |
|---|---|---|---|
| භාණ්ඩ හා සේවා ශුද්ධ | = | - 170 | |
| ප්‍රාථමික ආදායම් ශුද්ධ | = | - 25 | |
| ද්විතීක ආදායම් ශුද්ධ | = | 40 | |
| ජංගම ගිණුමේ ශේෂය | = | - 155 | **(ලකුණු 01)** |

ඊ)

| | | | |
|---|---|---|---|
| ජංගම ගිණුමේ ශේෂය | = | - 155 | |
| ප්‍රාග්ධන ශුද්ධ | = | 5 | |
| ජංගම සහ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | = | - 150 | **(ලකුණු 01)** |

iii.
- අපනයන විවිධාංගීකරණය කිරීම
- සාම්ප්‍රදායික අපනයන දිරිමත් කිරීම
- විදේශ රටවල් සමඟ වෙළෙඳ ගිවිසුම් වලට එළඹීම
- ආනයන ආදේශන කර්මාන්ත වැඩි දියුණු කිරීම
- අත්‍යවශ්‍ය ආනයන හැර අවශේෂ ආනයන අධෛර්යමත් කිරීමට කටයුතු කිරීම
- දේශීය උද්ධමනය පාලනය කොට අපනයනවල තරඟකාරීත්වය ඉහළ නැංවීම
- විනිමය අනුපාතිකය ක්ෂය වීමට ඉඩහැරීම හෝ අවප්‍රමාණය කිරීම **(ලකුණු 1x4)**


iv. නාමික විනිමය අනුපාතය :-
එක් මුදල් වර්ගයක මිල තවත් මුදල් වර්ගයකින් ප්‍රකාශ කිරීම නාමික විනිමය අනුපාතිකය වේ. **(ලකුණු 01)**
නාමික විනිමය අනුපාතිකය දෙයාකාරයකින් ප්‍රකාශ කෙරේ.

- විදේශ මුදල් ඒකකයක මිල දේශීය මුදල් ඒකක වලින් දැක්වීම (ඍජු කියවීම)
- දේශීය මුදල් ඒකකයක මිල විදේශ මුදල් ඒකක වලින් දැක්වීම (වක්‍ර කියවීම) **(ලකුණු 01)**

සඵල විනිමය අනුපතය :-
සඵල විනිමය අනුපාතිකය යනු කිසියම් මුදල් ඒකකයක අගය තවත් මුදල් වර්ග රාශියක පලතල සාමාන්‍ය අගයට සාපේක්ෂව ප්‍රකාශ කරීමය. එය ප්‍රකාශ කෙරෙනුයේ දර්ශක වශයෙනි. බරතැබීම සඳහා යොදාගැනෙන මුදල් ඒකක සමන්විත වනුයේ සලකා බලන රටෙහි වෙළෙඳ හවුල්කාරී සහ වෙළෙඳ තරඟකාරී රටවල මුදල් ඒකක වලිනි. **(ලකුණු 01)**
සඵල විනිමය අනුපාතිකයේ ස්වරූප දෙකකි.

- නාමික සඵල විනිමය අනුපාතිකය
- මූර්ත සඵල විනිමය අනුපාතිකය **(ලකුණු 01)**

v.




**(ලකුණු 02)**

රුපියලේ ඩොලර් අගය තීරණය වන විනිමය වෙළෙඳපොළෙහි හුවමාරුවන්නේ ඩොලර් සහ රුපියල්ය. මෙහි ඉල්ලුම් වක්‍රය පෙන්නුම කරනුයේ රුපියලට කරන ඉල්ලුමයි. එබැවින් එය නිරූපනය කරනුයේ ශ්‍රී ලංකාවේ අපනයන මිලදී ගන්නන්ගේ සහ ශ්‍රී ලංකාවට ප්‍රාග්ධනය රැගෙන එන්නන්ගේ ඉල්ලුමයි. රුපියලේ ඩොලර් අගය අඩුවෙත්ම රුපියල සාපේක්ෂව ලාභ වන නිසා රුපියලට විදේශ ඉල්ලුම වැඩිවේ. රුපියලේ ඩොලර් අගය ඉහළයත්ම රුපියල සාපේක්ෂව මිල අදික නිසා රුපියල සඳහා ඉල්ලුම අඩුවේ. මේ නිසා රුපියල ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට පහළ බසියි. **(ලකුණු 01)**

විනිමය වෙළෙඳපොලෙහි රුපියල් සැපයුම් වක්‍රය නිරූපණය කරනුයේ ශ්‍රී ලංකාවට ආනයන සඳහා සහ පිටතට ප්‍රාග්ධනය ගෙනයාම සඳහා කරනු ලබන ඉල්ලුමයි. මෙහි දී රුපියල විකුණන ඩොලර් ලබා ගනියි. රුපියලේ ඩොලර් අගය වැඩිවන විට ආනයන සාපේක්ෂව ලාභවන බැවින් ආනයන ඉල්ලුම වැඩිවන අතර ඒ අනුව රුපියල් සැපයුම ඉහළ නගියි. අනෙක් අතට රුපියලේ ඩොලර් අගය පහත බසින විට ආනයන සාපේක්ෂව මිල අධික වන බැවින් ආනයන ඉල්ලුම අධෛර්යමත්වේ. රුපියල් සැපයුම අඩුවේ. මේ අනුව රුපියල් සැපයුම් වක්‍රය ඉහළට බෑවුම්වන රේඛාවකි. **(ලකුණු 01)**


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
(අ.පො.ස. සා.පෙළ)
විද්‍යාව
A9+
GUIDE
PAST PAPERS
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
G.C.E. O/L
සිංහල
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440